කාර්යසාධන වාර්තාව

2021

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ජය මාවත, කටුබැද්ද, මොරටුව.

දුරකථන අංකය : 011-2044860

ෆැක්ස් අංකය : 011-2044879

වෙබ් අඩවිය : http://www.csd.lk

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



බලකා 24කින්, පුහුණු පාසල් 06කින් සහ විශේෂ ව්‍යාපෘති 03කින් සමන්විතව දිවයින පුරා ව්‍යාප්ත වෙමින් 34,500කට ආසන්න ශ්‍රම බලකායක් සහිතව ශ්‍රී ලංකාවේ ස්ථාපිත එකම පරිපූරක හමුදාව වශයෙන් තිස් වසරක කුරිරු යුද්ධයේ පශ්චාත් අවධිය තුළ රට නැවත ගොඩනැගීමේ මහඟු කර්තව්‍යයට තම දායකත්වය ලබාදෙමින් සිටින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වත්මන් ප්‍රගතිය පිළිබඳව සනිටුහන් වන 2021 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට මෙම පණිවුඩය නිකුත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි.

රටපුරා ශක්තිමත්ව විහිදුනු මෙම දෙපාර්තමේන්තු බලකා ජාලය තම ප්‍රධාන කාර්යයන්ට අමතරව කෘෂිකර්මාන්තය මුල්තැනට ගෙන වී වගාව ප්‍රමුඛ භෝග වගාවන්හි නියැලෙමින් දේශීය හරිත කෘෂිකර්මාන්තය ඔස්සේ තිරසර සංවර්ධන මාවතට එළඹ සිටී. දේශීය මෙන්ම විදෙස් වෙළඳපළෙහි අධික මිළ ගණන් යටතේ අලෙවි වන කජු වගාව, ශ්‍රී ලංකා කජු සංස්ථාව හා එක්ව උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතුව දිවයින පුරා සාර්ථකව ව්‍යාප්ත කරමින් අපනයන භෝග වගාවෙන් රටට සැලකිය යුතු මට්ටමේ විදේශ විනිමයක් උපයා දීමට දායකත්වය ලබාදීමට හැකිවීම ඉකුත් වසරේ අප ලබාගත් ජයග්‍රහණයක් බව සතුටින් සිහිපත් කළ හැකිය. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්ථයක් බවට පත් කිරීම උදෙසා ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ අගමැතිතුමන්ගේ උපදෙස් මත ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) මැතිතුමාගේ මාර්ගෝපදේශයෙන් හරිත කෘෂිකර්මාන්තය නගාසිටුවීම අරමුණු කොට ගත් රජයේ ප්‍රතිපත්තියට අනුව යමින් පසුගිය වසරේදී බලකා මට්ටමින් මහා පරිමාණයේ කාබනික පොහොර නිෂ්පාදනය ඇරඹී අතර, දෙපාර්තමේන්තුවේ පොහොර අවශ්‍යතාව ඒ මගින් සපුරා ගැනීමට බොහෝ දුරට හැකිවිය.

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්ය භාරයට අනුව යමින් අන්‍යාගමිකයන්ගේ ග්‍රහණයට නතු වෙමින් වල් බිහිව පැවති දීඝවාපී පුදබිම මෙන්ම කුරගල පුදබිම අතීතයේ පැවති ශ්‍රී විභූතිය නැවත ඉස්මතු වන අයුරින් ප්‍රතිසංස්කරණය කර ලෝකවාසී බෞද්ධ ජනයාගේ පහන් සංවේගය ඇතිකර ගෙන වන්දනාමානයේ යෙදීමට සුදුසු අයුරින් ගොඩ නැංවීම ලහි ලහියේ සිදුකරමින් පවතී. යුධ ජයග්‍රහණය සඳහා ජීවිත පරිත්‍යාගයෙන් මාහැඟි දායකත්වයක් ලබාදුන් වීරෝධාර රණ විරුවන්ගේ විජයග්‍රහණය සිහිපත් කරලීමට ඉදිකළ මහා ස්මාරකයක් බඳු වූ, සඳහිරු සෑ රදුන් ඉදිකිරීමේ දී විශේෂයෙන් සකස් කරන ලද ගඩොල් කැට ලක්ෂ 67ක් මෙන්ම අති විශාල ශ්‍රම දායකත්වයක් ලබා දෙමින් පසුගිය වසරේදී ජනී ජනයාගේ වන්දනාමාන පිණිස සහ සතු කොට පූජා කරලීමට හැකිවිය. එමෙන්ම විවිධ බාහිර පාර්ශ්වයන්ගේ බලපෑමට ලක්වෙමින් විනාශවීමේ තර්ජනයට මුහුණපා ඇති ඓතිහාසික වටිනාකම්වලින් යුක්ත වූ පුරා විද්‍යා ස්ථාන ආරක්ෂා කිරීමත්, විවිධ රාජ්‍ය ආතනයන්හි ආරක්ෂක සේවා සැපයීමේ කාර්යයත් මේ වන විට දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරමින් පවතී.

දිනූ දේශය වෙනුවෙන් මෙවන් සුවිශාල සේවයක් සපයන්නා වූ සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන්ගේ වෘත්තීය කුසළතා නංවාලීම සඳහා සුවිශේෂී ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ක්‍රියාවට නංවා ඇති අතර, විශේෂ අභිප්‍රේරණ ක්‍රමෝපායන් මගින් ඔවුන්ගේ ආකල්ප, කුසළතා මෙන්ම සේවා තෘප්තිය ඉහළ නැංවීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව නිවාස නොමැති සාමාජිකයින්හට නව නිවාස ලබාදීමද, අඩක් නිමකළ සහ වැඩ අවසන්කර නොමැති නිවාස සම්පූර්ණයෙන් ඉදිකර අවසන් කර ගැනීමට සහය ලබාදීමද, තම දුවා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වන පොත්පත්, ලැප්ටොප් පරිඝණක ආදී අධ්‍යාපනික උපකරණ නොමිලයේ ලබාදීමද මේ වන විට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සේවා වනිතා ඒකකය සහ සුබසාධක සංගමය හරහා සිදුකරමින් පවතී. එමගින් සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන්ගේ වෘත්තීය, සමාජයීය මෙන්ම ජීවන තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යාමට අත්වැලක් සපයා දීම මූලික පරමාර්ථය වී ඇත.

මාතෘ භූමියේ තිරසර සංවර්ධනය නංවාලීමටත්, නීතිය හා සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය සහය ලබා දීමෙන් රට ගොඩනැංවීමේ කාර්යය උදෙසා දිය හැකි උපරිම දායකත්වය ඉදිරියේදීත් අඛණ්ඩව ලබාදීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව බැඳී සිටින අතර, එම කාර්යයන් සක්‍රීයවත් සඵලදායී ලෙසත් ලබාදීමට කැපවී සිටින නිලධාරීන් ඇතුළු සිවිල් ආරක්ෂක කාර්ය මණ්ඩලයටත්, සිවිල් කාර්ය මණ්ඩලයටත් අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබෙවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

මේජර් ජෙනරාල් එන්ආර් ලමාහේවාගේ (විශ්‍රා)
ආර්ඛ්පී ආර්එස්පී එන්ඩීයූ
අධ්‍යක්ෂ ජනරාල්

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 2021 වසර තුල සිදු කල මෙහෙවරයන්හි ප්‍රගතිය පිළිබඳ සඳහන් කරන කාර්ය සාධන වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සළකමි.

අප මාතෘ භූමිය ත්‍රස්තවාදී තර්ජනවලට මුහුණ පා සිටි අවධියේ ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට සිය සහය ලබා දෙමින් තර්ජිත ගම්මාන සුරකිමින් සිවිල් ආරක්ෂක බලකාය මහත් මෙහෙවරක් ඉටු කරන ලද අතර, වර්තමානයේ රටේ සංවර්ධන ක්‍රියාවලියට ඍජුවම දායක වෙමින් ගමටත් නගරයටත් තම ශ්‍රමය හා මෙහෙවර ලබා දෙමින් සිටී. මේ වන විට මෙම පිරිස රාජ්‍ය සේවයේ ස්ථීර හා විශ්‍රාම වැටුප් හිමි ක්‍රියාකාරී පිරිසක් බවට පරිවර්තනය වී ඇත.

අප දෙපාර්තමේන්තුව විසින් දායකත්වය දක්වන්නා වූ සේවාවන් අතර, ආගමික ස්ථාන හා පූජා භූමි ආරක්ෂා කිරීම, වන අලි තර්ජන වලින් ජනතාව මුදාගැනීමට අලි වැටවල් ඉදි කිරීම, කෘෂි ව්‍යාපෘති පවත්වාගෙන යාම සහ ඊට අවශ්‍ය කාබනික පොහොර නිෂ්පාදනය කිරීම, රාජ්‍ය ආයතන හා ආගමික සිද්ධස්ථාන ඉදිකිරීම හා ආරක්ෂාව සැපයීම, දිවයින පුරා දුෂ්කර ප්‍රදේශවල නොමිලේ පෙර පාසල් පවත්වාගෙන යාම හා දුෂ්කර පළාත්වල ජනතාව සඳහා පානීය ජල බෙදාහැරීම් ස්ථාන ස්ථාපිත කොට ජලය බෙදා හැරීම යනාදිය සුවිශේෂී වේ.

පසුගිය වසරේ රට තුල කොවිඩ් - 19 රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා පොදු ස්ථාන විෂබීජහරණය කිරීම සහ සහන මිලට වියළි ආහාර බෙදා හැරීම වැනි ක්‍රියාවල නිරත වෙමින් මහජනතාවට මහත් වූ සහයෝගයක් දක්වන ලදී.

පසුගිය වසරේ සාර්ථකත්වය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමන් හා අප දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තුමාගෙන් ලද උපදෙස් හා මඟපෙන්වීම් බෙහෙවින් මහෝපකාරී වූ බව කෘතඥතාපූර්වකව සිහිපත් කරමි.

එමෙන්ම පසුගිය වසරේ සාර්ථකත්වය සඳහා දෙපාර්තමේන්තුව සමඟ රාජකාරී කරන ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සියලුම නිලධාරීන් සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ හා ඒකාබද්ධ සේවාවන්වල සියලුම නිලධාරී මහත්ම මහත්මීන් මෙන්ම සිවිල් ආරක්ෂක බලකායේ සියලුම නිලධාරීන් වෙත මාගේ ස්තුතිය පුද කර සිටිමි.

ඉදිරි වර්ෂයන්හීදී ද මෙවැනි කාර්යයන් ඉටු කිරීමට අප දෙපාර්තමේන්තුවේ සාමාජික සාමාජිකාවන් හට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබෙවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

යුඅයි සේරසිංහ ඩබ්ඩබ්වී ආර්එස්පී යුඑස්පී පිඑස්සි ඒඕඩබ්සි
රියර් අද්මිරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

කෙටි යෙදුම්

1.	ශ්‍රීලංපසේ	-	ශ්‍රී ලංකා පරිපාලන සේවය
2.	ශ්‍රීලංගසේ	-	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
3.	දෙපාර්.	-	දෙපාර්තමේන්තුගත තනතුරු
4.	අ.ජ/.	-	අධ්‍යක්ෂ ජනරාල්
5.	අ.අ.ජ/.	-	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
6.	අ/.	-	අධ්‍යක්ෂ
7.	අ.ජ.ලේ/.	-	අධ්‍යක්ෂ ජනරාල් ලේකම්
8.	අජමානි.	-	අධ්‍යක්ෂ ජනරාල් මාණ්ඩලික නිලධාරී
9.	නි/අ.	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ
10.	ස/අ	-	සහකාර අධ්‍යක්ෂ
11.	අ/නි.	-	අණදෙන නිලධාරී
12.	දෙ. අ/නි	-	දෙවන අණදෙන නිලධාරී
13.	මුඅනි	-	මූලස්ථාන අණදෙන නිලධාරී
14.	ඒඅනිමු/	-	ඒකාබද්ධ අණදෙන නිලධාරී මූලස්ථානය
15.	මානි.	-	මාණ්ඩලික නිලධාරී
16.	ව්‍යා/නි	-	ව්‍යාපෘති හාර නිලධාරී
17.	ශ්‍රීලයුහ	-	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
18.	ශ්‍රීලනාහ	-	ශ්‍රී ලංකා නාවික හමුදාව
19.	ශ්‍රීලගුහ	-	ශ්‍රී ලංකා ගුවන් හමුදාව
20.	සිආසේ	-	සිවිල් ආරක්ෂක සේවය
21.	පෞආනි/	-	පෞද්ගලික ආරක්ෂක නිලධාරී
22.	අ/රා	-	අධ්‍යයන රාජකාරී
23.	කසේනි	-	කළමනාකරණ සේවා නිලධාරී සේවය
24.	කාසේසේ	-	කාර්යාල සේවක සේවය
25.	පු.පා.	-	පුහුණු පාසල
26.	උපුපා/.	-	උසස් පුහුණු පාසල
27.	කි.මී.	-	කිලෝමීටර
28.	කි.ග්‍රෑ.	-	කිලෝග්‍රෑම්
29.	ලුතිකො	-	ලුතිනන් කොමාණ්ඩර්
30.	ලුතිකර්	-	ලුතිනන් කර්නල්
31.	ස.පො.අ	-	සහකාර පොලිස් අධිකාරී
32.	ප්‍ර.පො.ප	-	ප්‍රධාන පොලිස් පරීක්ෂක
33.	පො.ප	-	පොලිස් පරීක්ෂක
34.	උ.පො.ප	-	උප පොලිස් පරීක්ෂක
35.	ප්‍රා/ලේ	-	ප්‍රාදේශීය ලේකම්
36.	දි/ලේ	-	දිස්ත්‍රික් ලේකම්
37.	දිනි	-	දිස්ත්‍රික් නිලධාරී

දෙපාර්තමේන්තු පරිපාලන කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය -

අ අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	මේජර් ජෙනරාල්	ඩීඑස්එන්කේ සේනාධීර ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ	අධ්‍යක්ෂ ජනරාල් (2021.01.15 - 2021.07.05)
2	මේජර් ජෙනරාල්	එන්ආර් ලමාහේවාගේ ආර්ඩබ්පී ආර්එස්පී එන්ඩීයූ	අධ්‍යක්ෂ ජනරාල් (08.07.2021 දින සිට)
3	බ්‍රිගේඩියර්	වී වීරක්කොඩි (විශ්‍රාමික) එම්අයිඑම්	අධ්‍යක්ෂ (පාලන)
4	කර්නල්	ටීඑච්ඩීඑස්ආර් තිරිමාන්න යූඑස්පී	අධ්‍යක්ෂ ජනරාල් ලේකම්
5	කර්නල්	එම්එස්සී පිරිස් ආර්එස්පී යූඑස්පී	අධ්‍යක්ෂ (මෙහෙයුම්)
6	කර්නල්	පීකේබීආර් මිල්ලවාන	අණදෙන නිලධාරි - වවුනියාව
7	කර්නල්	පීකේඑන්ආර් රත්නසිංහ	අධ්‍යක්ෂ (මෙහෙයුම්)
8	කර්නල්	එස්ඩබ්එස්පීඒඩබ්එම්ආර්ජේඑස්බී රත්වත්තේ	අධ්‍යක්ෂ (පිරිස් පාලන)
9	කර්නල්	ජේකේඑන්එස් ජයසිංහ කේඑස්පී	අධ්‍යක්ෂ (පුහුණු)
10	කර්නල්	එම්ජීජීඩබ්ආර් ගමගේ	අ/නිලධාරි - සිආදෙ මූලස්ථානය
11	කර්නල්	එච්කේඩීඩබ් වෛද්‍යතිලක	අධ්‍යක්ෂ (පිරිස් පාලන)
12	ලුති/කර්නල්	ටීජීඩීඑම්ඊබී දිසානායක ආර්ඩබ්පී ආර්එස්පී	අධ්‍යක්ෂ (පිරිස් පාලන)
13	ලුති/කර්නල්	එම්ජීඒ මලන්දෙනිය ආර්එස්පී	නි/ අධ්‍යක්ෂ (පිරිස් පාලන)
14	ලුති/කර්නල්	ඩබ්ඩීඑස් මොරවැටියේගෙදර	අ/ නිලධාරි - මොණරාගල
15	ලුති/කර්නල්	ඩීජේඑස් පොන්වීර	අ/ නිලධාරි - පොලොන්නරුව
16	ලුති/කර්නල්	එම්ඒඑච්ඩබ් ප්‍රේමචන්ද්‍ර ආර්එස්පී	අ/නිලධාරී- අනුරාධපුර
17	ලුති/කර්නල්	එස්එම්ආර්එස්පී අස්මඩල ආර්එස්පී යූඑස්පී අයිජී	අ/ නිලධාරි - වවුනියාව
18	ලුති/කර්නල්	එස්එම්ඒඑස් සේනානායක ආර්එස්පී අයිජී	අ/ නිලධාරි - විශ්වමඩු
19	ලුති/කර්නල්	ඩීඑම්ජේආර් දිසානායක යූඑස්පී පිඑස්සී අයිජී	අ/ නිලධාරි - කැබිතිගොල්ලෑව
20	ලුති/කර්නල්	ආර්ඒජේකේ රණසිංහ ආර්ඩබ්පී ආර්එස්පී	අ/ නිලධාරි - වෙන්නවත්ත
21	ලුති/කර්නල්	පීකේඑන් විජේසිංහ	අ/ නිලධාරී - වැලිඔය
22	ලුති/කර්නල්	බීඒයූ වික්‍රමනායක ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ	අධ්‍යක්ෂ ජනරාල් ලේකම්
23	ලුති/කර්නල්	ආර්එම්බී රත්නායක	අ/ නිලධාරි - ත්‍රිකුණාමලය
24	ලුති/කර්නල්	යූටීඑන් පෙරේරා	අ/ නිලධාරි - අම්පාර
25	ලුති/කර්නල්	ඩීඑම්එස්සී දසනායක යූඑස්පී	නි/ අධ්‍යක්ෂ (පිරිස් පාලන)
26	ලුති/කර්නල්	එච්බීඑම්බීඑන් බංඩාර ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී	ජ්‍යෙෂ්ඨ මා/ නිලධාරී - (මෙහෙයුම්)
27	ලුති/කර්නල්	ජීආර්යූබී අබේරත්න	අණදෙන නිලධාරි - සේරුවිල
28	ලුති/කර්නල්	ආර්එම්සීඑල්කේකේ රත්නායක	අධ්‍යක්ෂ (ව්‍යාපෘති / ආගමික)
29	ලුති/කර්නල්	පිඑච්එස් ගුණසේකර	අ/ නිලධාරි - සේරුවිල
30	ලුති/කර්නල්	ඩීපීඑන් පෙරේරා	අධ්‍යක්ෂ (සුභසාධන/ප්‍රවාහන)
31	ලුති/කර්නල්	එම්අයිවී ප්‍රනාන්දු	අ/නිලධාරී - විශ්වමඩු
32	ලුති/කර්නල්	එච්ආර්ඩබ් ද සිල්වා	අධ්‍යක්ෂ (සුභසාධන/ප්‍රවාහන)
33	ලුති/කර්නල්	ඒආර්ඩී ද සිල්වා	අ/ නිලධාරි- උහන
34	ලුති/කර්නල්	එල්ජීකේ කිත්සිරි	අ/ නිලධාරි - කතරගම
35	ලුති/කර්නල්	එච්කේඑස් ප්‍රියන්ත	ජ්‍යෙෂ්ඨ මා/ නිලධාරි -(මෙහෙයුම්)
36	ලුති/කර්නල්	එච්එස් ජයරත්න	අ/ නිලධාරි - විල්පත්තුව
37	ලුති/කර්නල්	ජේජේඩබ්කේ ද සිල්වා	සේවා වනිතා සම්/ නිලධාරි
38	ලුති/කර්නල්	කේඑන් සිල්වා	අ/ නිලධාරි - පහලලන්ද

39	ලුතිනල්	ඩබ්ඩිආර්ජේ කරුණාරත්න	අ/ නිලධාරි - මහනුවර
40	ලුතිනල්	එම්ජීකේ දයාප්‍රිය	අ/ නිලධාරි - සිආදෙ මූලස්ථානය
41	ලුතිනල්	බීඑච්ඩී පද්මකුමාර	වනජීවී සම්බන්ධීකරණ නිලධාරී
42	ලුතිනල්	ඩිඑස්පී ලියනගේ	අ/ නිලධාරි - සේරුපිට
43	ලුතිනල්	එල්ඒ වනසිංහ	අ/නිලධාරි - මහඔය
44	ලුතිනල්	බීජීඩී දේශප්‍රිය	අ/ නිලධාරි - කල්පිටිය
45	ලුතිනල්	ඩීඑස්පී විජේසිංහ	නි/අධ්‍යක්ෂ ප්‍රවාහන
46	ලුතිනල්	එස්එම්ඒඩීඑස්ඩබ්ලිව් ජයසේකර	අ/ නිලධාරි - මූලතිව්
47	ලුතිනල්	එස්ඒකේඩී ලේකම්ආරච්චි ආර්එස්පී	අ/ නිලධාරි - පුත්තලම
48	ලුතිනල්	පිඒඩීපී ගනේආරච්චි	නි/ අධ්‍යක්ෂ මෙහෙයුම්
49	ලුතිනල්	ඒඩී ගුණවර්ධන	අ/ නිලධාරි - ගෝමරන්කඩවල
50	ලුතිනල්	ඊආර්ටීඒ සමරකෝන්	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාපෘති)
51	ලුතිනල්	ඩීආර් තාරුකරත්න	අ/ නිලධාරි - ගල්කිරියාගම
52	මේජර්	ඩබ්එම්ආර්පී විජේරත්න	ජ්‍යෙෂ්ඨ මා/නිලධාරී (ප්‍රවාහන)
53	මේජර්	ඩබ්එම්එස්ආර් වීරකෝන්	අ/ නිලධාරි - සිආදෙ මූලස්ථානය
54	මේජර්	ඒපීඑස් අතපත්තු	අ/ නිලධාරි - හොරොව්පතාන
55	මේජර්	ඒ වර්ණකුලසූරිය	මා/නිලධාරී (ව්‍යාපෘති/ ඉදිකිරීම්)
56	මේජර්	එම්ටිපි සුජිත්	ජ්‍යෙෂ්ඨ මා/ නිලධාරි (ප්‍රවාහන)
57	මේජර්	එම්එඒඩී කුමාර	අ/ නිලධාරි - පොලොන්නරුව
58	මේජර්	එන්බීඒයුකේ නිශ්ශංක ආර්එස්පී	අ/නිලධාරි - මැදිරිගිරිය
59	මේජර්	ආර්එස්එම් විජේසිංහ	ව්‍යාපෘති අ/ නිලධාරී - කුරගල
60	මේජර්	ඩිඑම්ඩිඑස් දිසානායක ආර්එස්පී	අ/ නිලධාරි - කිලිනොච්චි
61	කපිතන්	ආර්එම්එස්කේ රත්නායක ආර්ඩබ්ලිපී ආර්එස්පී යූඑස්පී	දෙවන අ/ නිලධාරී - අම්පාර
62	කපිතන්	ටීඩබ්එම්කේ අබේසිංහ ආර්ඩබ්ලිපී	උප බලකා භාර නිලධාරි - වැලිසර
63	කපිතන්	ඒඑම්ඩබ් බංඩාර	දෙවන අ/ නිලධාරි - වෙන්නච්ච්ත
64	කපිතන්	ඒඩබ්එස්එස් වඩුගේ	දෙවන අ/ නිලධාරි - කොන්ඩච්චි
65	කපිතන්	ටිජීටීඑන් ආරියදාස	දෙවන අ/නිලධාරි - මහඔය
66	කපිතන්	ආර්ඩීආර්එම් ජයලත්	දෙවන අ/නිලධාරි - වෙන්නච්ච්ත

ශ්‍රී ලංකා නාවික හමුදා කාර්ය මණ්ඩලය

අ අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	රියර් අද්මිරාල්	බීඒජේ ආනන්ද පිරිස් ආර්එස්පී) වීඑස්වී යූඑස්පී පීඑස්සී එන්ඩීයූ ඩීඅයිඑස්එස්	අධ්‍යක්ෂ ජනරාල්
2	රියර් අද්මිරාල්	යූඅයි සේරසිංහ ඩබ්ඩබ්වී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඒඕඩබ්සී	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
3	කොමදෝරු	කේටීඩීපීසී ජයපාල	අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
4	කපිතාන්	ආර්කේසී ප්‍රියදර්ශණ	අ/ නිලධාරි - කටුනායක
5	කොමාන්ඩර්	ඩීඑම්පී සුනිල් ශාන්ත	අ/නිලධාරි - අම්පාර
6	කොමාණ්ඩර්	කේයුසි පෙරේරා	අ/ නිලධාරි - කොන්ඩච්චි
7	ලුතිනල්/කොමාණ්ඩර්	එල්අයි නිමල් ලංකා	අණහාර නිලධාරි -විහාරමහාදේවි
8	ලුතිනල්/කොමාණ්ඩර්	පීඑම්ජීබී කන්දෙගෙදර	අ/නිලධාරි - මිහින්තලය
9	ලුතිනල්/කොමාණ්ඩර්	ඩබ්එච් සංජීව	දෙවන අ/ නිලධාරි - කතරගම
10	ලුතිනල්/කොමාණ්ඩර්	ජීඑස් ලීලාරත්න	මා/නිලධාරි (ප්‍රසම්පාදන)
11	ලුතිනල්/කොමාණ්ඩර්	සීඑම්ආර් චන්ද්‍රසේකර	මා/නිලධාරි (ප්‍රසම්පාදන)
12	ලුතිනල්/කොමාණ්ඩර්	යූඑස් සම්පත්සිරි	නි/අධ්‍යක්ෂ (තාක්ෂණ)
13	ලුතිනල්/කොමාණ්ඩර්	එස්බී බමුණුගේ	අධ්‍යක්ෂ ජනරාල් ලේකම්
14	ලුතිනල්/කොමාණ්ඩර්	කේඑල්එස් කුමාර	මා/විශේෂ විමර්ෂණ නිලධාරි
15	ලුතිනල්/කොමාණ්ඩර්	එන්එස් කුමාරජෝති	නි/ අධ්‍යක්ෂ (තාක්ෂණ)
16	ලුතිනල්/කොමාණ්ඩර්	ජේඒආර්වයි ජයවර්ධන	දෙවන අ/නිලධාරි -මූලස්ථානය

17	ලුතිනන්/කොමාණ්ඩර්	ආර්ආර්ඩීපී කුමාර	දෙවන අ/ නිලධාරී - කතරගම
18	ලුතිනන්/කොමාණ්ඩර්	ඩීඅයිපී කුමාර	දෙවන අ/නිලධාරී - අම්පාර
19	ලුතිනන්/කොමාණ්ඩර්	ඩබ්එම්ජේඒකේබී කරුණාරත්න	නීති නිලධාරී

ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්ය මණ්ඩලය

අ අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	වින්ග් කමාණ්ඩර්	එන්එල්යූඒල් ලියනගේ	අධ්‍යක්ෂ ජනරාල් සහකාර ලේකම්
2	ස්කෝඩ්රන් ලීඩර්	එස්යූපිකේ ලින්කන්	අධ්‍යක්ෂ ජනරාල් සහකාර ලේකම්

ශ්‍රී ලංකා පොලිස් කාර්ය මණ්ඩලය

අ අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	සපොඅ	පීජීඒ විජේසුන්දර	අධ්‍යක්ෂ (පර්යේෂණ හා සැලසුම්)
2	සපොඅ	එම්එස් පෙරේරා	ස්ථානාධිපති - පොලිස් පාලන අංශය - සිඅදෙ
3	ප්‍රපොප	එස්කේ කරවිට	දෙවන අ/නිලධාරී - කටුනායක
4	ප්‍රපොප	ටිකේආර්ඩබ්එම්එස් බංඩාර	අ/නිලධාරී - කුරගල ව්‍යාපෘතිය
5	ප්‍රපොප	එම්එස් කුලනන්ද	දෙවන අ/ නිලධාරී - මොනරාගල
6	ප්‍රපොප	ඩබ්එස් බංඩාර	දෙවන අ/නිලධාරී - අනුරාධපුර
7	කාප්‍රපොප	එස්කේ මහානාම	මා/නිලධාරී (දුක්ගැනවිලි)
8	පොප	එච්එම්එස්කේ හේරත්	දෙවන අ/ නිලධාරී - හොරොව්පොතාන
9	පොප	එල්පී අබේවික්‍රම	දෙවන අ/ නිලධාරී - උහන
10	පොප	ඩීඑස් ජයරත්න	නි/අධ්‍යක්ෂ (ප්‍රවාහන)
11	පොප	ඩබ්එස් බන්දුල	මා/නිලධාරී (ක්‍රීඩා අංශය)
12	පොප	ජේඑල්පී ප්‍රියදර්ශන	දෙවන අ/නිලධාරී - මහනුවර
13	පොප	එම්එල්පීආර්කේ මුණසිංහ	දෙවන අ/නිලධාරී - සේරුවිල
14	පොප	බීඩීජේ ගුණසිංහ	දෙවන අ/නිලධාරී - කටුනායක
15	උපොප	ආර්ඒටීඑම් රණසිංහ	මා/නිලධාරී (මාධ්‍යය)
16	උපොප	එම්පීසීඑච් මාරසිංහ	මා/නිලධාරී (ප්‍රවාහන)
17	උපොප	ඩබ්ඒයූ පුෂ්පකුමාර	මා/නිලධාරී (ප්‍රවාහන)
18	උපොප	ආර්ඒයූ රූපසිංහ	මා/නිලධාරී (අධ්‍යක්ෂ මෙහෙයුම් කාර්යාලය)
19	උපොප	ඩබ්එම්ආර්කේ වික්‍රමසිංහ	දෙවන අ/ නිලධාරී - පහළලන්ද
20	උපොප	වයිබීඑන් බන්දුල	දෙවන අ/ නිලධාරී - ත්‍රිකුණාමලය
21	උපොප	බීජීඒටී බංඩාර	දෙවන අ/ නිලධාරී - ගෝමරන්කඩවල
22	උපොප	එල්පීඑන්සී සෝමතිලක	ව්‍යාපෘති අ/ නිලධාරී - මහමෙව්නා උයන
23	උපොප	ජේ විජේවර්ධන	දෙවන අ/නිලධාරී - අනුරාධපුර

දීපව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය

අ අ	නිලධාරියාගේ නම	තනතුර	ස්ථිර සේවය
1	ආර්ආර් බුලත්සිංහල මහත්මිය	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රීලංගසේ 1
2	පීජීඑස් ප්‍රියන්ත මහතා	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රීලංගසේ 1
3	ජේඒ ජෙරීඩ් මහතා	ස/අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)	ශ්‍රීලංගසේ 111
4	ඩීඑම් සජීවනී මහත්මිය	ස/ අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)	ශ්‍රීලංගසේ 111
5	කේකේපීඑස් රත්නායක මහත්මිය	ස/අධ්‍යක්ෂ (පාලන)	ශ්‍රීලංපසේ 111
6	වීආර් සම්පත් මහතා	ස/ අධ්‍යක්ෂ (ව්‍යාපෘති ගිණුම්)	ශ්‍රීලංගසේ 111

පටුන

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය - ..... **vii**

ශ්‍රී ලංකා නාවික හමුදා කාර්ය මණ්ඩලය ..... **viii**

ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්ය මණ්ඩලය ..... **ix**

දීපව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය ..... **ix**

1 **ආයතනික පැතිකඩයාවට නැංවීමේ සාරාංශයක්ර /** **1**

1.1 හැඳින්වීම 1

1.1.1 ප්‍රතිස්ථාපනය සහ විකාශනය 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 1

1.2.1 දැක්ම 1

1.2.2 මෙහෙවර 1

1.3 ප්‍රධාන කාර්යයන් 2

1.3.1 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා ඇති විවිධ විශේෂ ව්‍යාපෘති - 2

1.4 සංවිධාන සටහන 3

1.5 දෙපාර්තමේන්තුවේ යටතේ පවතින ප්‍රධාන අංශ 5

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 6

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 6

2 **ප්‍රගතිය හා ඉදිරි දැක්ම** **8**

2.1 දෙපාර්තමේන්තු ප්‍රගතිය 8

2.1.1 කාර්ය සමාලෝචනය හා ඉදිරි දැක්ම 10

2.2 මූලස්ථාන අංශයන්හි ප්‍රගතිය 18

2.2.1 අභ්‍යන්තර විගණන අංශය 18

2.2.2 ආයතන අංශය 19

2.2.3 වැටුප් අංශය 20

2.2.4 මෙහෙයුම් අංශය 22

2.2.5 පිරිස් පාලන අංශය 23

2.2.6 ව්‍යාපෘති අංශය 25

2.2.7 සේවා වනිතා අංශය 32

2.2.8 පර්යේෂණ හා සංවර්ධන අංශය 33

2.2.9 තාක්ෂණ හා නඩත්තු අංශය 33

2.2.10 මූලස්ථාන බලකාය 34

2.2.11 සුබසාධක අංශය 34

2.2.12 යහසාධක අරමුදල 35

2.2.13 සුවසවිය අරමුදල 36

2.4	බලකා මූලස්ථාන හා පුහුණු පාසල් ප්‍රගතිය	37
2.4.1	වෙන්නවත්ත බලකා මූලස්ථානය	37
2.4.2	කටුනායක බලකා මූලස්ථානය	41
2.4.3	මහනුවර බලකා මූලස්ථානය	44
2.4.4	පුත්තලම බලකා මූලස්ථානය	47
2.4.5	අනුරාධපුර බලකා මූලස්ථානය	50
2.4.6	විල්පත්තුව බලකා මූලස්ථානය	55
2.4.7	වවිනියාව බලකා මූලස්ථානය	58
2.4.8	කිලිනොච්චි බලකා මූලස්ථානය	62
2.4.9	විශ්වමඩු බලකාය	66
2.4.10	මුලතිව් බලකා මූලස්ථානය	69
2.4.11	වැලිඔය බලකා මූලස්ථානය	74
2.4.12	කැබිතිගොල්ලැව බලකා මූලස්ථානය	79
2.4.13	හොරොව්පොතාන බලකා මූලස්ථානය	84
2.4.14	ගෝමරන්කඩවල බලකා මූලස්ථානය	89
2.4.15	ත්‍රිකුණාමලය බලකා මූලස්ථානය	92
2.4.16	සේරුවිල බලකා මූලස්ථානය	96
2.4.17	පොළොන්නරුව බලකා මූලස්ථානය	101
2.4.18	මැදිරිගිරිය බලකා මූලස්ථානය	104
2.4.19	මහඔය බලකා මූලස්ථානය	108
2.4.20	උහන බලකා මූලස්ථානය	112
2.4.21	අම්පාර බලකා මූලස්ථානය	116
2.4.22	මොණරාගල බලකා මූලස්ථානය	119
2.4.23	කතරගම බලකා මූලස්ථානය	124
2.4.24	සේරුපිට සෞන්දර්ය පුහුණු පාසල	128
2.4.25	කල්පිටිය පුහුණු පාසල	131
2.4.26	ගල්කිරියාගම උසස් පුහුණු පාසල	133
2.4.27	පහළලන්ද පුහුණු පාසල	136
3	**2021 දෙසැම්බර් කාර්ය දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය සාධනය**	139
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	139
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	141
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	142
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	144
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	144

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 145

3.7 මු 208 .රෙ.ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම / දෙපාර්තමේන්තුවටදානය කරන ලද පළාත් සභාවට ප්‍ර /ක් ලේකම් කාර්යාලයටදිස්ත්‍රි / තිපාදනප්‍ර 145

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 145

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 146

4 **කාර්ය සාධන දර්ශක** **171**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (යාකාරී සැලැස්ම මත පදනම්වක්‍රි) 171

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු **(SDG)** සපුරා ගැනීමේ කාර්ය සාධනය.....173

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 173

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 177

6 **මානව සම්පත් පැතිකඩ** 179

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 179

6.1.1 අනුමත කාර්ය මණ්ඩලය 179

6.1.2 කාර්ය මණ්ඩල වර්ගීකරණය 181

6.1.3 සිවිල් ආරක්ෂක සාමාජික ව්‍යාප්තිය - **2021** දෙසැම්බර් **31** දිනට 182

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය 184

6.3 මානව සම්පත් සංවර්ධනය 185

7 **අනුකූලතා වාර්තාව** 188

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය - 320

1 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.1.1 ප්‍රතිස්ථාපනය සහ විකාශනය

1985 අංක 40 දරන මිනිස් බල උපයෝගීතා සහ පරිපූරක හමුදා පනතේ 52 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයාට පැවරී ඇති බලතල අනුව ශ්‍රී ලංකා පොලිස් සේවාවට ආධාර හා උපකාරී වීමේ කාර්යය සඳහා පිහිටුවන ලද "ග්‍රාමාරක්ෂක හමුදාව, 2006.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (අමප/06/135/206/052) අනුව "සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව" නමින් නව දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 23ක් සහ පුහුණු පාසල් 05ක් ස්ථාපිත කර ඇති අතර 35,000කට ආසන්න ශ්‍රම බලකායක් සේවයේ යෙදී සිටී.

2015 ජූනි මස 12 වැනි සිකුරාදා දිනැතිව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවේ පැවති දිස්ත්‍රික් නිලධාරී, පාලක/නියාමක, උප පාලක/ උප නියාමක, ග්‍රාම ආරක්ෂක/ සිවිල් ආරක්ෂක තනතුරු විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශයට පත් කර ඇත. තවද 2015 මාර්තු මස 05 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම දෙපාර්තමේන්තුව සතු සුවිශාල මිනිස් බල සංචිතය ඵලදායී ලෙස යොදා ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතු සිදු කිරීමේ හැකියාව සහ දෙපාර්තමේන්තුව ආදායම් උත්පාදනය කරන ආයතනයක් බවට පත්කිරීමේ හැකියාව සලකා දෙපාර්තමේන්තු කාර්යභාරය තවදුරටත් පුළුල් කරනු ලැබීය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1 දැක්ම

“ තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක් ”

1.2.2 මෙහෙවර

“ශ්‍රී ලංකා මාතෘ භූමියේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමට දිවි හිමියෙන් කැප වෙමින් ද, ජාතික සංවර්ධන හා ආර්ථික වර්ධන ඉලක්ක සාක්ෂාත් කරමින් ද, “පරිපූරක ශ්‍රම ආර්ථික බලකායක්” ලෙස සෞභාග්‍යයේ දැක්මට විශිෂ්ට පෙර ගමන්කරුවකු වීම.”

1.3 ප්‍රධාන කාර්යයන්

1. රටතුළ උද්ගතවන ආරක්ෂක තත්වයන් අනුව අවස්ථාවට උචිත පරිදි සන්නද්ධ සේවාවලට සහ පොලිස් සේවාවට ආධාර හා උපකාරීවීම සඳහා පරිපූරක හමුදාවක් වශයෙන් කටයුතු කිරීම.

2. ත්‍රස්තවාදී තර්ජන පවතින අවස්ථාවලදී ඊට ලක්වන ගම්බිම් හා නගර ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.

3. රටතුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා සන්නද්ධ හමුදාවන්ට සහ පොලිස් සේවාවට සහාය දීම.

4. ජාතික වැදගත්කමක් ඇති උත්සව හා වෙනත් වැදගත් අවස්ථාවන්හිදී ඊට අදාළ ආරක්ෂාව සැලසීමේ කටයුතුවල යෙදීම.

5. රටතුළ ඇතිවන විවිධ ආපදා අවස්ථාවන්හිදී (ගංවතුර, සුනාමි, නායයාම් වැනි) අපදා කළමනාකරණ කාර්යන්වලට සහාය වීම.

6. පළාත් සභා සහ පළාත් පාලන ආයතන, විහාරස්ථාන හා ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍යම පරිමාණ ඉදිකිරීම් කටයුතු ඉටු කරවා ගැනීමේදී ශ්‍රම බලකායේ සේවය ලබාදීම.

7. රාජ්‍ය ආයතනවලට ආරක්ෂක සේවා සපයා ගැනීමේදී මෙම දෙපාර්තමේන්තුව සමග ගිවිසුම් ගතව ආරක්ෂක සේවාවන් ලබාදීම.

8. දෙපාර්තමේන්තුව සතු සංස්කෘතික කණ්ඩායම්වල සේවය රාජ්‍ය ආයතනවල උත්සව අවස්ථාවන් සඳහා ලබාදීම.

9. අලි මිනිස් ගැටුම් හේතුවෙන් අදාළ ප්‍රදේශවල සිදුවන හානි අවම කිරීම පිණිස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහායවීම සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සේවය එම දෙපාර්තමේන්තුව වෙත ලබා දීම.

10. දිවයින පුරා පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම සහ සංචාරක වශයෙන් වැදගත්කමක් ඇති ස්ථාන සඳහා අවශ්‍ය වන පරිදි ආරක්ෂාව සැලසීම.

11. සමාජ සුබසාධන ක්‍රියාකාරකම් වලට සහාය වීම.

12. ජනාධිපතිතුමා , විෂයභාර අමාත්‍යතුමා හෝ රජය විසින් නියම කරනු ලබන විශේෂිත කාර්යයන්වල යෙදීම.

1.3.1 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා ඇති විවිධ විශේෂ ව්‍යාපෘති -

අංක 1462 / 20 හා 2006.09.13 දිනැති ඇති විශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2015 මාර්තු 05 දිනැති අංක අ/ම/ප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් පවරන ලද ඉහත රාජකාරිවලට අමතරව රජය විසින් වරින් වර පහත සඳහන් රාජකාරි ද පවරා ඇත.

- දිවයින පුරා වී, ධාන්‍ය, එළවළු, පලතුරු, පශු ආදී විවිධ මහා පරිමාණ ව්‍යාපෘති මගින් රටේ ජාතික ආහාර නිෂ්පාදනය ශක්තිමත් කිරීම.

- අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටුවා ඇති මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන මගින් යහපත් ළමා පරපුරක් බිහි කිරීමට සහාය වීම.

- ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම.

- උතුරු හා උතුරුමැද ප්‍රදේශ ආවරණය වන පරිදි විශාල ප්‍රමාණයේ ජල පෙරන යන්ත්‍ර ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම.

1.4 සංවිධාන සටහන


සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය
අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ඒකාබද්ධ සේවයේ රියදුරු - 30,
නියාමක (විශේෂ /1) - 3200, උප නියාමක - 6510, සිවිල් ආරක්ෂක භට - 29790, නියාමක (විශේෂ) රියදුරු - 30, නියාමක (1) - 70, , උප නියාමක රියදුරු - 90, සිවිල් ආරක්ෂක භට රියදුරු - 210,
සහපාරක්ෂක කම්කරු - 30

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු

බලකා/පුහුණු පාසල්/ව්‍යාපෘති කාර්යාල ස්ථානගත වීම



1.5 දෙපාර්තමේන්තුවේ යටතේ පවතින ප්‍රධාන අංශ

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 23 ක් සහ පුහුණු පාසල් 04ක් ක්‍රියාත්මක වන අතර බලකා මූලස්ථාන/ පුහුණු පාසල් අණදෙන නිලධාරීන් සහ දෙවන අණදෙන නිලධාරීන් මගින් එකිනෙක බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්හි පරිපාලන කටයුතු සිදු වේ.

දෙපාර්තමේන්තුව සතු 35,000කට ආසන්න මානව සම්පත විවිධ ක්ෂේත්‍රගත ව්‍යාපෘති වෙත යොමු කරවීම දෙපාර්තමේන්තු මූලස්ථානයේ මෙහෙයවීමෙන් බලකා මූලස්ථාන/ පුහුණු පාසල් මගින් සිදු කෙරේ.

බලකා මූලස්ථාන - 24

1. මූලස්ථානය
2. වෙන්නවත්ත බලකා මූලස්ථානය
3. කටුනායක බලකා මූලස්ථානය
4. මහනුවර බලකා මූලස්ථානය
5. පුත්තලම බලකා මූලස්ථානය
6. අනුරාධපුර බලකා මූලස්ථානය
7. විල්පත්තුව බලකා මූලස්ථානය
8. වව්නියාව බලකා මූලස්ථානය
9. කිලිනොච්චි බලකා මූලස්ථානය
10. විශ්වමඩු බලකා මූලස්ථානය
11. මුලතිව් බලකා මූලස්ථානය
12. වැලිඔය බලකා මූලස්ථානය
13. කැබිතිගොල්ලෑව බලකා මූලස්ථානය
14. හොරොව්පොතාන බලකා මූලස්ථානය
15. ගෝමරන්කඩවල බලකා මූලස්ථානය
16. ත්‍රිකුණාමලය බලකා මූලස්ථානය
17. සේරුවිල බලකා මූලස්ථානය
18. පොළොන්නරුව බලකා මූලස්ථානය
19. මැදිරිගිරිය බලකා මූලස්ථානය
20. මහඔය බලකා මූලස්ථානය
21. උහන බලකා මූලස්ථානය
22. අම්පාර බලකා මූලස්ථානය
23. මොණරාගල බලකා මූලස්ථානය
24. කතරගම බලකා මූලස්ථානය

පුහුණු පාසල් - 05

1. සේරුපිට සෞන්දර්ය පුහුණු පාසල
2. කල්පිටිය පුහුණු පාසල
3. මිහින්තලේ පුහුණු පාසල
4. ගල්කිරියාගම උසස් පු-හුණු පාසල
5. පහළලන්ද පුහුණු පාසල

දෙපාර්තමේන්තු මූලස්ථානය මඟින් බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්වලට අදාළ පාලන කටයුතු සිදු කරන අතර දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශ 27ක් යටතේ එම පාලන කාර්යන් විමධ්‍යගත කර ඇත.

i. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය
ii. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
iii. අභ්‍යන්තර විගණන අංශය
iv. ආයතන අංශය
v. ගිණුම් අංශය
vi. වැටුප් අංශය
vii. මෙහෙයුම් අංශය
viii. පිරිස් පාලන අංශය
ix. ප්‍රසම්පාදන අංශය
x. ප්‍රවාහන අංශය
xi. පුහුණු අංශය
xii. ව්‍යාපෘති අංශය
xiii. සුබසාධක අංශය
xiv. තාක්ෂණ හා නඩත්තු අංශය
xv. පර්යේෂණ හා සංවර්ධන අංශය
xvi. මාධ්‍ය අංශය
xvii. ක්‍රීඩා අංශය
xviii. පෞද්ගලික ලිපි ගොනු අංශය
xix. විදුලි වැට සම්බන්ධීකරණ ඒකකය
xx. සේවා වනිතා ඒකකය
xxi. යහසාධක අරමුදල
xxii. සුවසවිය අරමුදල
xxiv. විශ්‍රාම වැටුප් අංශය

එක් එක් බලකා මූලස්ථාන, පුහුණු පාසල් සහ දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශයන්ට අදාළව 2021 වර්ෂය සඳහා සැලසුම්ගත කාර්යන්හි කාර්යසාධනය වෙන් වෙන්ව දක්වා ඇත.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

I. සුවසවිය අරමුදල

II. යහසාධක අරමුදල

III. සුබසාධන අරමුදල

IV. ක්‍රීඩා අරමුදල

V. බෞද්ධ අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ව්‍යාපෘතියේ නම	-	නැත
දායක නියෝජිතායතනය	-	
ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මී	-	
ව්‍යාපෘති කාල සීමාව	-	

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 දෙපාර්තමේන්තු ප්‍රගතිය

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යුද විජග්‍රහණයෙන් පසු නැගෙනහිර නවෝදය, උතුරු වසන්තය, සෞභාග්‍යයේ පෙර දැක්ම වැනි රජයේ ජාතික සංවර්ධන සංග්‍රාමයන්ට දායක විය. ඒ අනුව, රටේ අහාර ඉල්ලුමට සරිලන වී, ධාන්‍ය, එළවලු වැනි මහා පරිමාණ කෘෂි, පශු ව්‍යාපෘතීන් ද , ගඩොල්, බ්ලොක් ගල් වැනි ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය ව්‍යාපෘතින් ද ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතීන් මේ වන විට වාර්ෂිකව ඉතා විශාල මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලබන දීර්ඝ කාලීන ආයෝජන ලෙස ක්‍රියාත්මක වන අතරම, රටේ ජාතික සංවර්ධනයට ද අඛණ්ඩ දායකත්වයක් දරනු ලබයි.

ඊට අමතර වශයෙන් මෙම දෙපාර්තමේන්තු භටයන් රාජ්‍ය ආයතන ආරක්ෂක රාජකාරි, නර්තන හා සංගීත කණ්ඩායම් සේවා , ඉදිකිරීම්, නඩත්තු හා විවිධ සේවා සැපයීම තුළින් ද අදායම් උත්පාදනය කිරීමට සමත් වී ඇත.

ඒ අනුව උක්ත අදායම් ලෙස, 2021 වර්ෂය තුළ පමණක් රුපියල් මිලියන 769.5 ක් රජයේ අදායමට බැර කර ඇත.

2014 වර්ෂයේ සිට වාර්ෂිකව රජයේ ආදායම් බැර කර ඇති ආදායම් විස්තර පහත පරිදි වේ.

ව්‍යාපෘති කාණ්ඩය	2014	2015	2016	2017	2018	2019	2020	2021
කෘෂි පශු ගඩොල්	27	295	631	541	375	382	482.5	379.2
ආරක්ෂක සේවා ආදායම්	38	25	204	312	491	606	375.7	320.5
නර්තන හා සංගීත ආදායම්	-	-	27	11	6	17	3	1.6
නඩත්තු සේවා ආදායම්	-	-	23	19	22	24	17.5	25.58
ඉදිකිරීම් සේවා ආදායම්	-	-	30	58	87	102	90.5	1.57
විවිධ ආදායම්	4	3	141	202	16	25	9	41.06
එකතුව	69	323	1,056	1,143	997	1,156	978.2	769.5



ඒ ඒ බලකා මුලස්ථාන , පුහුණු කඳවුරු මගින් 2021 වර්ෂය තුළ රජයේ අදායමට බැර කරන ලද ව්‍යාපෘති හා සංස්කෘතික ආදායම් සටහන

2021 වර්ෂයට අදාළව ඉහත 2.1. වගුව මගින් කෘෂි, පශු, ගඩොල්, යන කාණ්ඩ යටතේ පොදුවේ දක්වා ඇති අදායම ඒ ඒ බලකා මුලස්ථාන , පුහුණු කඳවුරු යටතේ වෙන් වෙන් වශයෙන් ඒ ඒ ආයතනයන්හි ප්‍රගතිය ලෙස පහත දක්වා ඇත. තවද, පහත දක්වා ඇති අදායම් හා ව්‍යාපෘති ඒ ඒ බලකා මුලස්ථාන, පුහුණු කඳවුරු යටතේ වැඩිදුරටත් සවිස්තරාත්මකව දක්වා ඇත.

බලකා මූලස්ථානය / පුහුණු පාසල්	2021 වර්ෂයේ රජයේ ආදායමට බැර කරන ලද මුදල (.රු)
වෙන්නවත්ත	717,071.00
කටුනායක	362,855.00
මහනුවර	299,094.00
පුත්තලම	11,674,039.75
අනුරාධපුර	7,462,522.57
විල්පත්තුව	5,225,531.90
වව්නියාව	24,033,036.40
කිලිනොච්චි	19,385,630.50
විශ්වමඩු	10,101,800.72
මුලතිව්	10,858,916.00
වැලිඔය	32,199,139.75
කැබිතිගොල්ලෑව	17,374,838.32
හොරොව්පොතාන	17,367,299.68

ගෝමරන්කඩවල	15,835,506.50
ත්‍රිකුණාමලය	12,227,807.43
සේරුවිල බලකාය	7,433,517.38
පොළොන්නරුව	15,576,544.90
මැදිරිගිරිය	7,331,125.97
මහඔය	4,802,109.50
උහන	27,634,196.71
අම්පාර	31,348,493.28
මොණරාගල	46,110,854.50
කතරගම	510,273.13
ගල්කිරියාගම	34,689.00
කල්පිටිය	621,708.70
පහළලන්ද	1,168,100.00
කොන්ඩච්චිය	51,237,500.00
කුරගල ව්‍යාපෘතිය	301,152.10
එකතුව	**379,235,354.69**



2.1.1 කාර්ය සමාලෝචනය හා ඉදිරි දැක්ම

2.1.1.1 පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියා කිරීම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණය -

යුද විජයග්‍රහණයෙන් අනතුරුව රටතුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවට සහ පොලිස් සේවාවට සහාය වීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයක් වේ. ඒ අනුව 2021වර්ෂය තුළ දිවයින පුරා පොලිස් ස්ථාන 300 ක් සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින් 2206 ක් අනුයුක්ත කරනු ලැබීය. මෙම කාර්යන් ඉදිරි වර්ෂයන්හී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ඊට අමතර වශයෙන් පහත පරිදි දෙපාර්තමේන්තු මානව සම්පත විවිධ කාර්යන්හි යොදවා ඇත .

පුරාවිද්‍යා හා භූජාභූමි ආරක්ෂක / නඩත්තු	-	3,307
රාජ්‍ය ආයතන ආරක්ෂක	-	1,884
ජීවිතාරක්ෂක හා මුදවාගැනීම්	-	503
විහාරමහා දේවි උද්‍යානය රාජකාරී	-	89
කාක දූපත වෙරළ උද්‍යාන රාජකාරී	-	20
කොටුව පාවෙන වෙළඳසැල රාජකාරී	-	26
පාර්ලිමේන්තු ක්‍රීඩාංගනය රාජකාරී	-	12
වෙරළ පිරිසිදු කිරීමේ රාජකාරී	-	102
කටුනායක ගුවන්තොටුපල ආරක්ෂක රාජකාරී	-	20





2.1.1.2 *ජාතික උත්සව සහ වෙනත් වැදගත් අවස්ථා සඳහා දායකත්වය*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විධායක ජනාධිපති හා සේනාධිනායක අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ නිදහස් චතුරස්‍රයේදී පෙබරවාරි 04 වන දින පෙරවරුවේ පැවති 73 වන නිදහස් දින සැමරුම් පෙළපාලිය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මහත් අභිමානයෙන් සහභාගීවිය.

නිදහස් සැමරුම් උළලේ ආචාර පෙළපාලිය සඳහා නිලධාරීන් 10 දෙනෙකුගෙන් සහ සිවිල් ආරක්ෂක භටයින් 278 දෙනෙකුගෙන් සමන්විතව අංශ දෙකක් සමඟ තූර්ය වාදක කණ්ඩායම සහ සංස්කෘතික කණ්ඩායමද සහභාගී විය.



2.1.1.3 *දීඝවාපී දාගැබ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය -*

දීඝවාපී දාගැබ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය අතිගරු ජනාධිපති තුමාගේ සංකල්පයකට අනුව 2020.10.22 වන දින ආරම්භ කරන ලදි. සිවිල් ආරක්ෂක භටයන් 300ක් පමණ එහි ඉදිකිරීම් හා කැණීම් කටයුතු සඳහා යොදවා ඇත.

චෛත්‍ය සඳහා අවශ්‍ය ඉංජිනේරු ගඩොල් 25,000,000ක් (දෙකෝටි පනස් ලක්ෂයක්) නිෂ්පාදනය කිරීමේ වගකීම ද සිවිල් ආරක්ෂක බලකාය වෙත පැවරී ඇත.





2.1.1.4 *යලි පිබිදෙන කුරගල පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව හා පුදබිම ඉදිකිරීම් ව්‍යාපෘතිය -*

2013.04.26 වන දින එවක ආරක්ෂක ලේකම් වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් කුරගල සංචාරයේදී අන්‍යාගමික ග්‍රහණයට හසු වී තිබූ කුරගල පුරාවිද්‍යා ස්මාරක සහිත පූජණීය ස්ථාන මුල්කොට ගෙන එම ගමෙහි පදිංචි තරුණයන් 54 දෙනෙකු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට බඳවාගෙන කුරගල පුජා භූමි සංරක්ෂණ කටයුතු සඳහා යොදවන ලෙස උපදෙස් ලබා දෙන ලදි. එම ස්ථානය මේ වන විට කුරගල ව්‍යාපෘති කාර්යාලය නමින් පවත්වා ගෙන යන අතර, ඒ සඳහා 205 ක භට පිරිසක් අනුයුක්ත කර ඇත. ඔවුන් පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව හා සංරක්ෂණයන්ට අමතරව විවිධ වගා ව්‍යාපෘති , රාජ්‍ය ආයතන ආරක්ෂක රාජකාරි ආදීයෙහි ද යොදවා ඇත.













2.1.1.5 *අනුරාධපුර සඳහිරු සෑය බුද්ධ ශාසනයේ උන්නතිය උදෙසා සහ සතු කොට පූජා කිරීම*

තිස්වසරක් පුරා ලක්ධරණීතලය වෙලාගත් සාපලත් ත්‍රස්තවාදයට නැවතීමේ තිත තැබීමට දායක වූ ත්‍රිවිධ හමුදා, පොලිසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජික සාමාජිකයින්ට උපහාර පුදනු වස් අනුරාධපුර යුගයේදී ඉදිවූ මහා චෛත්‍යවලින් පසු නූතන යුගයේ ඉදිවූ විශාලතම චෛත්‍ය ලෙස සැලකෙන සඳහිරු සෑයේ කොත්වහන්සේ නිරාවරණය කොට ලෝකවාසී ජනීජනයාගේ වන්දනාමානය උදෙසා සඟසතුකොට පූජාකිරීමේ පූන්‍යෝත්සවය 2021 නොවැම්බර් මස 18 වන ඉල් පොහෝය දින අනුරාධපුරයේදී පැවැත්විණි.

යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ,පොලිසියේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජික සාමාජිකයන්ගේ ශ්‍රම දායකත්වයෙන් සඳහිරු සෑයේ ඉදිකිරීම් කටයුතු සිදුකෙරුණු අතර, 2012 වර්ෂයේ සිට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විල්පත්තුව බලකායේ ඇලයාපත්තුව ගඩොල් ව්‍යාපෘතිය මගින් ස්තූප ගඩොල් ලක්ෂ 67ක් පමණ ප්‍රමාණයක් සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සුරතින් සඳහිරු සෑයේ ඉදිකිරීම් කටයුතු සඳහා නිෂ්පාදනය කර ලබා දී ඇත. එලසම චෛත්‍ය ඉදිකිරීම් කටයුතු සඳහා සහ දෛනික වතාවත් සඳහාද සිවිල් ආරක්ෂක සාමාජිකයන්ගේ දයකත්වය ලබා දෙන ලදී.

සඳහිරු සෑයේ ඉදිකිරීම් වෙනුවෙන් කැපවී ක්‍රියා කළ සිවිල් ආරක්ෂක සාමාජිකයින් ඇගයීම උදෙසා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් ඇගයීමේ සහතිකපත් ලබා දීමද මෙහිදී සිදු විය.













2.1.1.6 *මහරගම අපේක්ෂා රෝහලේ "අපේක්ෂාවේ යථාර්තය" වාට්ටුව විවෘත කිරීම*

කොරෝනා ආසාදිත පිළිකා රෝගීන් සඳහා විශේෂ කොරෝනා ප්‍රතිකාර වාට්ටුවක අවශ්‍යතාව මහරගම අපේක්ෂා රෝහල් අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය විජිත් ගුණසේකර මහතා විසින් පෙන්වා දීමෙන් අනතුරුව "දින දහයෙන් ඇඳන් දහසක්" ව්‍යාපෘතියේ දිගුවක් ලෙස ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිතව ශ්‍රී ලංකා යෞවන සම්මේලනය හා එක්ව Global Wings Charity සංවිධානයේ මූල්‍ය පරිත්‍යාගයෙන්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ මාගා ඉංජිනේරු ආයතනයේ තාක්ෂණික ඉංජිනේරු දැනුම භාවිතා කරමින්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පූර්ණ ශ්‍රම දායකත්වය ලබාදෙමින් මෙම "අපේක්ෂාවේ යථාර්තය" නම්වූ විශේෂ කොරෝනා ප්‍රතිකාර වාට්ටුවේ ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී.

සිවිල් අරක්ෂක සාමාජිකයින්ගේ දැඩි උනන්දුව හා කැපවීම මත සිව් මසක් වැනි කෙටිකාලයක් තුළදී මෙම වාට්ටුවේ ඉදිකිරීම් කටයුතු ඉතා සාර්ථක අයුරින් අවසන් කිරීමට හැකි විය.






2.1.1.7 *ජාතික රුක්රෝපණ ව්‍යාපෘතිය සඳහා කුඹුක් පැළ 10000ක් පරිත්‍යාග කිරීම*

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මේජර් ජෙනරාල් එන්ආර් ලමාභේවාගේ (විශ්‍රාමික) මැතිතුමාගේ උපදෙස් මත මහඔය බලකාය වෙතින් පවත්වාගෙන යනු ලබන කුඹුක් පැළ ව්‍යාපෘතියෙන් කුඹුක් පැළ 10000ක් පරිසර අමාත්‍ය ගරු මහින්ද අමරවීර මැතිතුමා වෙත සංකේතාත්මකව භාර දීම 2021 ඔක්තෝබර් මස 10 වන දින යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයට අයත් දියවන්නා ඔය අශ්‍රිතව සිදුකරන ලදි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා 72 වන සංවත්සරය සමරනු වස් යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක "තුරු මිතුරු නව රටක්" සහ පරිසර අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන "සුරකිමු ගංගා", "හුස්මදෙන තුරු දසතින්ම" ව්‍යාපෘතිය යටතේ යුද්ධ හමුදාව හා පරිසර අමාත්‍යාංශය ඒකාබද්ධව කුඹුක් පැළ 10000ක් සිටුවීමේ ජාතික ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කුඹුක් පැළ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පරිත්‍යාග කිරීම මෙහිදී සිදු කරන ලදි.




2.1.1.8 *සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පළමු කාබනික පොහොර තොගය සඳහිරු සෑය පූජා භූමියේ උද්‍යාන අලංකරණය සඳහා ප්‍රදානය කිරීම*

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජික සාමාජිකාවන් විසින් නිෂ්පාදනය කළ පළමු කාබනික පොහොර තොගය ලෙස අනුරාධපුර බලකාය මගින් නිපදවූ කාබනික පොහොර කිලෝ 3000ක් ඓතිහාසික අනුරාධපුර පුදබිමේ ඉදිවෙමින් පවතින සඳහිරු සෑ පූජා භූමියේ උද්‍යාන අලංකරණ කටයුතු සඳහා 2021 සැප්තැම්බර් මස 13 වන දින අධ්‍යක්ෂ ජනරාල් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) එන්ආර් ලමාහේවාගේ මැතිතුමා විසින් ප්‍රදානය කරන ලදි.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට ප්‍රකාරව නිරෝගී පරපුරක් රටට උරුමකරදීමේ උතුම් වූ පරමාර්ථය මල්ඵල ගැන්වීම සඳහා සක්‍රීය දායකත්වය ලබා දෙමින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සිදුකරනු ලබයි. දිවයින පුරා විහිදී තිබෙන සියළුම බලකායන් විසින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර ජාතික අවශ්‍යතාවය මත කෘෂිකාර්මික කටයුතු සඳහා ලබා දීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.









ඊට අමතර වශයෙන් අම්පාර බලකාය මගින් නිෂ්පාදනය කළ කාබනික පොහොර කිලෝ 5000ක ප්‍රමාණයක් රසායනාගාර පරීක්ෂණයන්ට ලක්කර තත්ව පරීක්ෂාවක් සිදුකිරීමෙන් අනතුරුව රජයේ ලක් පොහොර සමාගමේ අම්පාර ගබඩාව වෙත 2021 දෙසැම්බර් මස 08 වන දින භාර දෙන ලදී.





2.1.1.9 *වෙරළ පවිත්‍ර කිරීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය*

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් මීගමුව සිට කොළඹ දක්වා වෙරළ තීරයේ අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටයින් 400 දෙනෙකු අනුයුක්ත කරන ලදි.මේ අනුව දෛනිකව වෙරළ තීරයට එක් රැස්වන අපද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව ඉවත් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ උපදෙස් සහ පූර්ණ අධීක්ෂණය යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටයින්ගේ ශ්‍රම දායකත්වයෙන් සිදු කරනු ලැබේ.





2.1.1.10 *කොන්ඩච්චිය කජු වගා ව්‍යාපෘතිය*

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යමින් අස්වනු නෙලීම් සිදුකරන අක්කර 1200ක කොණ්ඩච්චි කජු වගාවට අමතරව කජු සංස්ථාව සතු භූමියෙන් අක්කර 500 ක භූමියක් මෙම දෙපාර්තමේන්තුවට වගා කටයුතු සඳහා ලබා දෙන ලදි. එම භූමිය එළිපෙහෙළි කිරීම, මූලික බිම් සැකසීම, ද්විතීක බිම් සැකසීම හා ශාක රෝපණය කිරීම ආදී සියලුම ක්‍රියාවන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් හා තාක්ෂණික දැනුම භාවිතා කරමින් සිදුකරනු ලබයි. මෙම භූමියේ සිටුවීම සඳහා අවශ්‍ය කජු පැළ 13,000ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තු සාමාජිකයින් විසින්ම තවාන් දමා ඇති අතර, දැනට බිම් සකසා ඇති වගා භූමියේ කජු වගාව ආරම්භ කර ඇත.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් වගා කරනු ලබන කජු අක්කර 1200ක භූමිය හා කජු සංස්ථාව මගින් පවත්වාගෙන යනු ලබන අක්කර 4500ක භූමිය වටා කි.මී.32 කින් යුත් ආරක්ෂිත විදුලි වැටක් ඉදිකිරීම සඳහා කජු සංස්ථාව මඟින් අමුද්‍රව්‍ය, තාක්ෂණික මෙවලම් හා ප්‍රතිපාදන ලබා දීමටත්, එහි ඉදිකිරීම් කටයුතු සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමජිකයින්ගේ පූර්ණ තාක්ෂණික දැනුම හා ශ්‍රම දායකත්වය ලබා දීමටත් එකඟ වී ඇත.






2.1.1.11 ඉදිකිරීම් කටයුතු සඳහා දායකත්වය

ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා මේසන්, වඩු, විදුලි කාර්මික , ජලනල කාර්මික වැනි ක්ෂේත්‍රයන්ගේ පුහුණු සිවිල් ආරක්ෂක ශ්‍රමිකයන්ගේ සේවය රාජ්‍ය අංශයේ විවිධ ආයතන වෙත හා ආගමික සිද්ධස්ථාන වෙත ලබා දෙනු ලබයි.
ඒ යටතේ 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති සාරාංශය පහත පරිදි වේ.

අනු අංකය	ඉදිකිරීම් ව්‍යාපෘතියේ විස්තර	යොදවා ඇති භටයින් ගණන
1	පල්ලන්සේන බන්ධනාගාරයේ දෙමහල් ගොඩනැගිලි 04ක් ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා පුහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	55
2	රාජ්‍ය ඔසුසල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පුහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	16
3	නැගෙනහිර කොළඹ මුල්ලේරියාව රෝහලේ රුධිර කාන්දුකරණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරීම් ව්‍යාපෘතිය සඳහා පුහුණු/ නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	8
4	තංගල්ල රෝහලේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා පුහුණු/ නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	22
5	අපේ ගම පරිශ්‍රය පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම	7
6	රිදියගම සෆාරී උද්‍යානය ඉදිකිරීම් ව්‍යාපෘතිය	28
7	දිවයින පුරා විහාරස්ථාන ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘති 831	3,307





2.1.1.12 විදුලි වැට ඉදිකිරීම් හා නඩත්තු කටයුතු

අලිමිනිස් ගැටුම් බහුලව පවතින ප්‍රදේශවල මිනිස් හා හස්ති ජීවිත බේරා ගැනීම සඳහා වනජීවී අමාත්‍යාංශය හා ඒකාබද්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වන අලි කලමනාකරණ හා පලවා හැරීම්, අලිවැට ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ සිවිල් ආරක්ෂක භටයන් 4521ක් යොදවා දිග 4645Km ක් වන විදුලි වැටවල් 316ක් නඩත්තු කර පවත්වාගෙන යනු ලබයි.





2.1.1.13 *පාසල් හා පෙර පාසල් දූ දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීම -*

දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල් වෙත ගුරුවරුන් අනුයුක්ත කිරීම

දිවයිනේ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි ගුරුවරුන් හිඟ පාසල්වල දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කරනු වස්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් සුදුසුකම් ලත් ගුරුවරුන් 186 ක් පාසල් 138 ක් වෙත අනුයුක්ත කර ඇත. ඔවුන් විසින් 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටි දරුවන් එම විභාගයන්ගෙන් විශිෂ්ට ලෙස සමත් කරවීමට කටයුතු කර ඇත. එබැවින්, පළාත් මට්ටමින් ඔවුන් ඇගයීමට ද ලක් වී ඇත.

ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම -

මේ යටතේ විශේෂයෙන්ම උතුරු, උතුරුමැද හා නැගෙනහිර පළාත් වල පාසල් 138ක් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 186ක් අනුයුක්ත කර ඇත.





2.1.1.14 *නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි*

විහාර මහා දේවී උද්‍යානය, කාක දූපත වෙරළ උද්‍යානය, කොළඹ පාවෙන වෙළඳ සංකීරණය, මාදිවෙල ඇවිදින මංතිරුව ආදී ස්ථාන රාශියක නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි සඳහා හටයන් 250 දෙනෙකු වර්ෂය පුරා රාජකාරියෙහි අනුයුක්ත කර ඇත.







ඉහත කාර්යන් ද ඇතුළුව රටේ කාලීන අවශ්‍යතාවයන් අනුව වරින් වර රජය සහ ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවරනු ලබන විශේෂ ව්‍යාපෘතීන් ඉදිරි වර්ෂයන්හී ද අඛණ්ඩව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ඉටු කෙරෙනු ඇත.

2.2 මූලස්ථාන අංශයන්හි ප්‍රගතිය

2.2.1 අභ්‍යන්තර විගණන අංශය

අරමුණු හා විෂය පථය -

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මෙහෙවර හා අරමුණ ඉටුකර ගැනීමට සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේද ස්ථාපනය කිරීම හා මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා මග පෙන්වීම.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථානය හා ඒ යටතේ ඇති බලකා, විශේෂ ව්‍යාපෘති හා අනෙකුත් ඒකකයන්හි පහත සඳහන් රාජකාරි ඉටු කිරීම.

i අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි සඵලදායිත්වය තක්සේරු කිරීම.

ii ප්‍රතිපත්ති, සැපයුම් හා ක්‍රියාපටිපාටි නිති රෙගුලාසිවලට අනුකූලව සිදුවන්නේද යන වග සමාලෝචනය කිරීම.

iii වත්කම් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

iv අවශ්‍ය අවස්ථාවලදී විමර්ශන පැවැත්වීම.

v වාර්ෂික විගණන සැලසුම් ක්‍රියාත්මක කිරීම.

vi විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කැඳවීම.

කාර්යය වැඩසටහන /	නිමැවුමේ කාර්ය සාධනය මනිනු ලබන ඒකකය	භෞතික කාර්ය සාධන ප්‍රගතිය
අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අභ්‍යන්තර විගණන සැලැස්ම	අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඉදිරිපත් කර ඇත.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම	කමිටු රැස්වීම්	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක්පවත්වා ඇත
බලකා කඳවුරු විගණනය කිරීම	බලකා මූලස්ථාන අභ්‍යන්තර විගණන පරීක්ෂාවන්	බලකා පුහුණු පාසල් අටක් භෞතික පරීක්ෂා කර විගණනය කර ඇත.
පුහුණු පාසල් විගණනය කිරීම	පුහුණු පාසල් බලකා මූලස්ථාන අභ්‍යන්තර විගණන පරීක්ෂාවන්	
විශේෂ ව්‍යාපෘති පරීක්ෂාව හා ව්‍යාපෘති ප්‍රගති සමාලෝචනය	අලිවැට. නඩත්තු. ඉදිකිරීම් සහ ආරක්ෂක සේවා පිළිබඳ විගණන වාර්තා	අලිවැට සහ ආරක්ෂක සේවා පිළිබඳ විගණන පරීක්ෂාවන් සිදුකර ඇත.
විගණන විමසුම් අවම කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම	පුහුණු වැඩසටහන්	දිස්ත්‍රික් නිලධාරින්ට දැනුවත් කිරීම් වැඩසටහන් පවත්වා ඇත.
ගෙවීම් වවුචර පරීක්ෂාව	වවුචර නියැදි පරීක්ෂාව	ගෙවීම් වවුචර් නියැදි පරීක්ෂාවක් සිදුකර ඇත.
රජයේ විගණන විමසුම්වලට පිළිතුරු කැඳවීම	විගණන විමසුම් ලේඛනය	රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා විගණන විමසුම් ලේඛනය අමාත්‍යාංශ ලේකම් වෙතින් යාවත්කාලීන කර ඇත.
විශේෂ විමර්ශන සිදුකිරීම	විශේෂ විමර්ශන වාර්තා	විශේෂ විමර්ශන අටක් සිදු කර ඇත.
රාජ්‍ය නොවන අරමුදල් විගණනය කිරීම	අරමුදල් විගණන වාර්තා	අරමුදල් විගණන වාර්තා හයක් ඉදිරිපත් කර ඇත

2.2.2 ආයතන අංශය

කාර්යය	කාර්ය සාධනය
2021 වර්ෂයේ පාලන හා මූල්‍ය කටයුතු යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තු චක්‍රලේඛ නිකුත් කිරීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙළ කිරීම	චක්‍රලේඛ - 04 අමාත්‍ය මණ්ඩල සංදේශ - 04
2020 කාර්ය සාධන වාර්තාව නිකුත් කිරීම	01
2022 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	01 කාර්තු ප්‍රගතිය සෑම කාර්තුවක් අවසනදීම සකසා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම
දෙපාර්තමේන්තුවෙහි සේවය කරන දීපව්‍යාප්ත හා ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන්ගේ සියලුම පරිපාලන කටයුතු සිදුකිරීම.	දීපව්‍යාප්ත නිලධාරීන් - 04 සංවර්ධන නිලධාරී - 01 ක/ සේවා නිලධාරීන් - 11 රියදුරු - 16 සනීපාරක්ෂක කම්කරු - 18 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ සියලුම රාජකාරීන්
දෙපාර්තමේන්තුවේ සියලුම සිවිල් නිලධාරීන්ගේ හා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ ආපදා ණය ඉල්ලුම්පත් සම්බන්ධව කටයුතු සිදුකිරීම	ආපදා ණය ගොනු 750 ක් පිළියෙළ කර අනුමැතිය සමග ගෙවීමට යොමු කිරීම
දෙපාර්තමේන්තු මූලස්ථානයේ හා බලකා මූලස්ථානවල මාසික දුරකථන, ජල , විදුලි , පුවත්පත් බිල්පත් හා ගොඩනැගිලි කුලී මුදල් නිරවුල් කිරීම	දුරකථන වවුචර - 85 ජල බිල් වවුචර - 117 විදුලි බිල් වවුචර - 85 ක් වවුචර සකසා අනුමත කර ගිණුම් අංශය වෙත යොමු කර ඇත.
මූල්‍ය පාලනය සඳහා අධ්‍යක්ෂ ප්‍රධාන ගණකාධිකාරිට සහාය වීම	සියලුම අතිකාල, ගමන් වියදම් වවුචරපත් අනුමත කිරීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩල / කමිටු වාර්තා අත්සන් තැබීම.
කාර්ය මණ්ඩල සාකච්ඡා පැවැත්වීම හා පසු විපරම් කටයුතු සිදුකිරීම	සාකච්ඡා හා පසු විපරම් 9 ක් පවත්වා අංශයේ රාජකාරීන් යාවත්කාලීන කරන ලදී.
අග්‍රහාර ප්‍රතිලාභ ගොනු රක්ෂණ භාර අරමුදල වෙත යොමු කිරීම	ගොනු 6312 ක් පමණ පිළියෙළ කර ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කිරීම.

➢ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අලුතින් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කර ගැනීම හා දැනට අනුමත කර ඇති උසස් කිරීමේ පරිපාටිය වර්තමාන අවශ්‍යතාව පරිදි සංශෝධනය කිරීම.

➢ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම කාර්යමණ්ඩලය නියෝජනය වන ලෙස කාර්ය සාධන ගිවිසුම් සකස් කරවීම හා මානව සම්පත් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කරවීම සඳහා උපදෙස් ලබා දීම හා අධීක්ෂණය .

➢ තිරසර සංවර්ධන ජාතික සභාව හා සම්බන්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණු හා උපායමාර්ග හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාරම්භක කරන ලදී. එම ක්‍රියාවලිය මේ වන විට 80 % ක පමණ ප්‍රගතියක් ලබා ගෙන ඇත. තවද තිරසර සංවර්ධන ජාතික සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශ යවත්කාලීන කරන ලදී.

➢ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පුරවැසි ප්‍රඥප්තිය සැකසීම ක්‍රියාරම්භක කර කෙටුම්පත සමාලෝචනය කෙරෙමින් පවතී.

➢ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථාන හා බලකා සාමාජිකයන් කාර්යාල ක්‍රම හා ආයතන කාර්ය පරිපාටින් සම්බන්ධව පුහුණු කිරීම සඳහා පුහුණු වැඩමුළු 03ක් පවත්වා තිබීම.

2.2.3 වැටුප් අංශය

(මුදල තිරුවේ අගයන් රුපියල් වලිනි)

මාසය	දිස්ත්‍රික් නිලධාරී		නියාමක විශේෂ		නියාමක		උප නියාමක		සිවිල් ආරක්ෂක භට		එකතුව		අබාධිත සහ මියගිය	
	නිලධාරී සංඛ්‍යාව	මුදල	නිලධාරී සංඛ්‍යාව	මුදල	නිලධාරී සංඛ්‍යාව	මුදල	නිලධාරී සංඛ්‍යාව	මුදල	නිලධාරී සංඛ්‍යාව	මුදල	නිලධාරී සංඛ්‍යාව	මුදල	නිලධාරී සංඛ්‍යාව	මුදල
ජනවාරි	61	2.66	623	28.19	1665	71.88	5470	218.90	27265	1005.54	35084	1327.17	271	5.98
පෙබරවාරි	61	2.66	623	28.19	1657	71.62	5453	218.29	27231	1004.37	35025	1325.13	269	5.95
මාර්තු	61	2.66	622	28.06	1657	71.61	5448	218.08	27211	1003.65	34999	1324.06	269	5.95
අප්‍රේල්	61	2.66	617	27.92	1658	71.60	5443	217.90	27207	1003.16	34986	1323.24	269	5.95
මැයි	61	2.66	615	27.83	1654	71.48	5437	217.65	27135	1000.71	34902	1320.33	267	5.92
ජූනි	61	2.68	616	27.82	1653	71.81	5435	218.94	27118	1006.64	34883	1327.89	265	5.87
ජූලි	61	2.68	612	27.66	1650	71.73	5422	218.45	27068	1004.51	34813	1325.03	263	5.82
අගෝස්තු	60	2.64	609	27.63	1640	71.33	5417	218.16	27018	1002.85	34744	1322.61	261	5.75
සැප්තැම්බර්	60	2.64	608	27.60	1643	71.37	5409	217.86	26984	1001.53	34704	1321.00	259	5.73
ඔක්තෝබර්	61	2.69	608	27.61	1634	71.14	5395	217.43	26948	1000.87	34646	1319.74	257	5.68
නොවැම්බර්	61	2.69	607	27.49	1632	70.96	5384	217.01	26905	999.28	34589	1317.43	256	5.67
දෙසැම්බර්	61	2.69	603	27.40	1620	70.55	5357	216.10	26841	997.32	34482	1314.06	256	5.67

2021 වර්ෂයේ වැටුප් ගෙවීමට අදාළ වැය විෂය සාරාංශය - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

(මුදල තිරුවේ අගයන් රුපියල් මිලියන වලිනි)

	2021						
	මාසය	1001	1003	1001	1003	1001	1003
		සේවක වැටුප්		මියගිය හා අබාධිත රණවිරුවන්		එකතුව	
1	ජනවාරි	967,370,148.00	361,472,759.48	4,574,437.50	1,409,850.00	971,944,585.50	362,882,609.48
2	පෙබරවාරි	966,076,818.00	391,850,075.20	4,549,187.50	1,402,050.00	970,626,005.50	393,252,125.20
3	මාර්තු	964,959,599.00	400,759,836.05	4,549,187.50	1,402,050.00	969,508,786.50	402,161,886.05
4	අප්‍රේල්	964,526,184.38	386,401,342.45	4,549,187.50	1,402,050.00	969,075,371.88	387,803,392.45
5	මැයි	962,505,291.35	414,091,259.57	4,523,937.50	1,394,250.00	967,029,228.85	415,485,509.57
6	ජූනි	970,150,292.63	405,150,600.05	4,486,062.50	1,382,550.00	974,636,355.13	406,533,150.05
7	ජූලි	967,983,579.33	410,034,290.52	4,448,187.50	1,370,850.00	972,431,766.83	411,405,140.52
8	අගෝස්තු	966,377,912.60	418,495,219.29	4,397,687.50	1,355,250.00	970,775,600.10	419,850,469.29
9	සැප්තැම්බර්	964,782,448.00	393,548,184.99	4,378,750.00	1,349,400.00	969,161,198.00	394,897,584.99
10	ඔක්තෝබර්	964,265,027.56	416,943,474.81	4,340,875.00	1,337,700.00	968,605,902.56	418,281,174.81
11	නොවැම්බර්	962,403,768.05	417,606,361.17	4,334,562.50	1,335,750.00	966,738,330.55	418,942,111.17
12	දෙසැම්බර්	960,610,419.58	389,702,874.12	4,334,562.50	1,335,750.00	964,944,982.08	391,038,624.12
එකතුව						**11,635,478,113.48**	**4,822,533,777.70**

2.2.4 මෙහෙයුම් අංශය

කාර්යභාරය:-

(අ) දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතුවලට අදාළ මාණ්ඩලික රාජකාරි හා මෙහෙයුම් රාජකාරිවලට අදාළ ප්‍රතිපත්ති සැලසුම් කිරීම් හා අනුමැතියෙන් පසු ක්‍රියාත්මක කිරීම.

(ආ) මෙහෙයුම් රාජකාරිවලට අමතරව අදාළ ව්‍යුහය හා සංකල්පය සම්බන්ධයෙන් බලකා මූලස්ථාන /උප බලකා මූලස්ථාන හා පුහුණු පාසල් භාර නිලධාරීන්ගේ දැන ගැනීමට ලක් කිරීම.

(ඇ) සිවිල් ආරක්ෂක සාමාජිකයින් හට මෙහෙයුම් නියෝග හා උපදෙස් නිකුත් කිරීම.

ව්‍යාපෘතිය / වැඩසටහන		භට සංඛ්‍යාව	ප්‍රගතිය
විවිධ	සෑම පෝය දිනකම කන්දකුලිය ශ්‍රී සමුද්‍රාසන්න විහාරස්ථානයට දහවල් දානය පිරිනැමීම	03	වැඩසටහන් ගණන 03
	සෑම මාසකම 28 දින රෙඩ්බානා විහාරස්ථානයට හා 06 දින සමුද්‍රාසන්න විහාරයට උදේ සහ දිවා දානය පිරිනැමීම	03	වැඩසටහන් ගණන 12/ 12
	පොත් බෙදාදීම්	03	වැඩසටහන් ගණන 12
ශ්‍රමදාන ඩෙංගු / කොවිඩ් මර්දන	ඩෙංගු මර්දන වැඩසටහන්	01	පොත් බෙදාදී ඇති ළමුන් 17
	නිරෝධායන මධ්‍යස්ථාන	27	වැඩසටහන් ගණන 03

2.4.26 ගල්කිරියාගම උසස් පුහුණු පාසල

අ. හැඳින්වීම -

2006.10.19 වන දින සිවිල් ආරක්ෂක බලකා උසස් පුහුණු පාසල ආරම්භ කරන ලද අතර,පුහුණු පාසල ආරම්භ කිරීමේ ප්‍රධාන අභිප්‍රාය වුයේ නන්දිමිත්‍ර පුහුණු පාඨමාලාව හා විශේෂ ක්‍රියාන්විත සඳහා පාඨමාලා ආරම්භ කිරීමවේ.යුද්ධය අවසන් වීමෙන් පසු මූලික පුහුණු ,නායකත්ව පුහුණු,වෙනත් රාජ්‍ය ආයතනවල වල පුහුණු පාඨමාලා පවත්වමින් මෙම පුහුණු පාසල වෙතින් දායකත්වයක් සපයා ඇත.

ආ. කාර්ය භාරය-

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු පුහුණු පාඨමාලා පවත්වමින් දෙපාර්තමේන්තු සාමාජිකයන්ගේ දැනුම වර්ධනය කිරීම හා පුහුණු පාඨමාලාවන් නොමැති කාල සිමාවේදි ප්‍රජා වැඩසටහන් ,සමාජ සුබ සාධන වැඩසටහන් සඳහා දායකත්වය සපයනු ලබයි.

ඇ. පිහිටීම



ඇ. <u>කාර්ය මණ්ඩල සංඛ්‍යා සංයුතිය</u>

කාර්යය මණ්ඩල සංඛ්‍යා සංයුතිය (ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් කාර්ය මණ්ඩල)	
තනතුර	සංඛ්‍යාව
ලුතිතන් කර්නල් - අණදෙන නිලධාරී - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	1
බනි ii - සරඹ උපදේශක - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	1
කෝප්‍රල් - උපදේශක රාජකාරි	2
සැරයන් - උපදේශක රාජකාරි,ප්‍රධාන ලිපිකරු	4
රියදුරු - ඒකාබද්ධ සේවය	1
මුළු එකතුව	9

කාර්යය මණ්ඩල සංඛ්‍යා සංයුතිය (සිවිල් ආරක්ෂක බලකා)		
තනතුර	පි	කා
දිස්ත්‍රික් නිලධාරි	1	-
නියාමක විශේෂ	-	-
නියාමක	4	-
උප නියාමක	29	9
සිවිල් ආරක්ෂක	78	8
මුළු එකතුව		130

ඉ. <u>උසස් පුහුණු පාසල වෙතින් සිදුකරනු ලබනකාර්යයන්-</u>

අඅ.	කාර්යය	යොදවා ඇති භට සංඛයාව
01	පුහුණු පාසල තුළ රාජකාරි	89
02	පොලිස් ස්ථානයේ රාජකාරි	01
03	ආගමික ස්ථාන රාජකාරි	18
04	ජල පෙරණ යන්ත්‍ර නඩත්තු රාජකාරි	03
05	කොම්පොස්ට් ව්‍යාපෘතිය	06
06	වී වගා ව්‍යාපෘතිය	13
එකතුව		130



ඊ. <u>ආදායම් ලබන ව්‍යාපෘති විස්තර -</u>

ආදායම් ලබන ව්‍යාපෘති			
අනු අංකය	ව්‍යාපෘතිය	යෙද වූ භට සංඛ්‍යාව	භෞතික ප්‍රගතිය ලැබූ ආදායම (රු.)
01	කෘෂි (වී/)	13	863,505.00
02	කම්මල	02	4,189.00
03	සංගීත කණ්ඩායම	7	30,000.00
එකතුව			**897,694.00**



ඌ. අනෙකුත් වැඩසටහන් / ව්‍යාපෘති

ව්‍යාපෘතිය / වැඩසටහන		යෙදූ වූ හට සංඛ්‍යාව	ප්‍රගතිය *(සංඛ්‍යාත්මක තොරතුරු ඇතුලත් කරන්න)*
වෙනත් සේවාවන්	රාජ්‍ය ආයතන ආරක්ෂක	15/20	2021.06.01 දින සිට 2021.07.09 වන දින දක්වා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ආරක්ෂක රාජකාරි සඳහා භටයින් 15 දෙනෙකු යෙදවූ අතර,2021.05.06 දින සිට 2021.05.31 වන දින දක්වා භටයින් 20 දෙනෙකු ඉහත දක්වා ඇති රාජකාරිය සඳහා ලබා දී ඇත.
ක්‍රීඩා හා සුබ සාධන	නිරොධායන මධ්‍යස්ථානක් ලෙස	65	පුහුණු පාසල නිරොධායන මධ්‍යාස්ථානයක් ලෙස 2021 වර්ෂයේදී යොදවා ඇත
	ජල පෙරණ රාජකාරි	03	දෛනිකව රාජකාරියේ යොදවා ඇත
පුරාවිද්‍යා,ආගමික සිද්ධස්ථාන නඩත්තු,සංවර්ධන	අවුකන විහාරස්ථානයේ නඩත්තු රාජකාරි	10	නේවාසිකව භටයින් 10 දෙනෙකු යොදවා දෛනිකව රාජකාරි සිදු කරනු ලබයි
	විහාරස්ථාන ආරකෂක	6	ආරක්ෂක රාජකාරි සිදුකරනු ලබයි
සේවා වනිතා	පෙර පාසල් හා මූල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	-	*නොමැත*
	පොත් බෙදාදීම්	1	කාර්ය මණ්ඩලය 93 දෙනෙකුගේ දරුවන් සඳහා පොත් ලබා දී ඇත
ශ්‍රමදාන ඩෙංගු මර්ධන කොවිඩ් මර්ධන	ඩෙංගු මර්ධන	31	ඩෙංගු මර්ධන ශ්‍රමදාන 03
	ශ්‍රම දායකත්ව ලබා දීම්	49	ශ්‍රම දායකත්ව ලබා දීම් 24

ඍ. නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස මෙම පුහුණු පාසල ලබා දීම

2021 වර්ෂයේ දී පුහුණු පාසල පහත පරිදි කණ්ඩායම් නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස භාවිත කරන ලදි.

- 2020.12.25 වන දින සිට 2021.01.06 වන දින දක්වා 73 වන නිදහස් පෙළ පාළියට සහභාගි වන භටයන් 42
- 2021.02.04 වන දින සිට 2021.02.22 වන දින දක්වා නිදහස් පෙළපාළියට සහභාගී වූ භටයන් 130
- 2021.05.30 වන දින සිට 2021.12.31. වන දින දක්වා කොරෝනා අතරමැදි රෝහලක් පුහුණු පාසලේහි ස්ථාපනය කල අතර, එහිදි කාන්තාවන් 2500 කට වැඩි පිරිසක් ප්‍රතිකාර ලබා ඇත.

2.4.27 පහළලන්ද පුහුණු පාසල

අ. හැඳින්වීම -

මෙම පුහුණු පාසල 1987 වර්ෂයේ අම්පාර පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී ආරම්භ කරන ලදී. අනතුරුව 1995 වර්ෂයේ අම්පාර නගර සභා පරිශ්‍රය වෙත රැගෙන යාමෙන් අනතුරුව 2001 වර්ෂයේදී අම්පාර දිස්ත්‍රික්කයේ දමන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පහළලන්ද ග්‍රාමසේවා වසමට අයත් මෙම ස්ථානයේ සිවිල් ආරක්ෂක බලකා පුහුණු පාසල ආරම්භ කර ඇත.

ආ. කාර්ය භාරය -

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පුහුණු කාර්යාලය මගින් ලබාඅදෙනු ලබන උපදෙස් පරිදි පුහුණු පාඨමාලාවන් පැවැත්වීම

රටෙහි ඇතිවන ආපදා තත්වයන්ට (ගංවතුර, නායයෑම් වැනි) විවිධ අයුරින් සහය ලබා දීම

රටතුළ පවතින කොරෝනා වෛරසය වැලැක්වීමේ නිරෝධායන කටයුතු වලට සහය ලබාදීම.

ප්‍රජාසංවර්ධන වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීම සිදු කරනු ලබයි.

දීඝවාපිය චෛත්‍ය ප්‍රතිසංස්කරණ විශේෂ ව්‍යාපෘතිය සඳහා භටපිරිස් යොදවීම.

ඇ. පිහිටීම -



උ. කාර්යය මණ්ඩලය

කාර්යය මණ්ඩල සංඛ්‍යා සංයුතිය (ත්‍රිවිධ හමුදා, පොලිස් හා සිවිල් කාර්ය මණ්ඩල)	
තනතුර	**සංඛ්‍යාව**
ලුතිනන් කර්නල් - අණදෙන නිලධාරී - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	01
උප පොලිස් පරීක්ෂක - දෙවන අණදෙන නිලධාරී - ශ්‍රී ලංකා පොලිසිය	01
බළලත් නිලධාරී II - සරඹ උපදේශක - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	01
ව/සැරයන් - කණිෂ්ඨ උපදේශක - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	01
කෝප්‍රල් - ශරීරික අභ්‍යාස උපදේශක , අවිගබඩා භාරකරු - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	01
රියදුරු - ඒකාබද්ධ සේවය	01
සනිපාරක්ෂක කම්කරු - ඒකාබද්ධ සේවය	03
මුළු එකතුව	**10**

කාර්යය මණ්ඩල සංඛ්‍යා සංයුතිය (සිවිල් ආරක්ෂක බලකා)		
තනතුර	**පි**	**කා**
දිස්ත්‍රික් නිලධාරි	-	01
නියාමක විශේෂ ශ්‍රේණිය	01	-
නියාමක	05	-
උප නියාමක	39	06
සිවිල් ආරක්ෂක	37	03
මුළු එකතුව		92



ඔ. <u>අනෙකුත් වැඩසටහන් / ව්‍යාපෘති -</u>

ව්‍යාපෘතිය / වැඩසටහන		යෙදූ වූ හට සංඛ්‍යාව	ප්‍රගතිය
ක්‍රීඩා හා සුභසාධන	සෑම මසකම 12 වන දින අම්පාර සරණ වැඩිහිටි නිවාසය සඳහා දහවල් දානය පිරිනැමීම.	04	වැඩසටහන් 12
පුරාවිද්‍යා, ආගමික සිද්ධස්ථාන නඩත්තු, සංවර්ධන	දීඝවාපිය චෛත්‍ය ප්‍රතිසංස්කරණ විශේෂ ව්‍යාපෘතිය සඳහා භටපිරිස් යෙදවීම.	27	2021 පෙබරවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මාස 11 ක් භටපිරිස් රාජකාරි යෙදවීම.
සේවා වනිතා	පොත් බෙදාදීම්	05	දරුවන් 123 දෙනෙකු සඳහා අභ්‍යාස පොත් 957 ක් බෙදාදීම.
ශ්‍රමදාන ඩෙංගු මර්ධන කොවිඩ් මර්ධන	ඩෙංගු මර්ධන / ශ්‍රමදාන	25	ඩෙංගු මර්ධන / ශ්‍රමදාන වැඩසටහන් 18
	නිරෝධායන මධ්‍යස්ථාන	81	වැඩසටහන් 01

3 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය වර්තමාන වර්ෂය (2021)	සටහන		තත්‍ය		
			වර්තමාන වර්ෂය **2021**	ඉකුත් වර්ෂය නැවත ගලපන **2020**	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	**ඒසීඒ -1**
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
-	**මුළු ආදයම් ලැබීම් (අ)**		-	-	
-	**ආදයම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		15,870,000,000	16,347,250,000	**ඒසීඒ -3**
-	තැන්පතු		845,298,908	818,550,058	**ඒසීඒ -4**
-	අත්තිකාරම් ගිණුම්		369,086,396	113,492,746	**ඒසීඒ -5**
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		17,084,385,304	17,279,292,804	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**17,084,385,304**	**17,279,292,804**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		-	-	
	අඩු කළා: වියදම		-	-	
-	**පුනරාවර්තන වියදම්**		-	-	
17,857,000,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	16,621,075,668	16,904,299,390	
1,178,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	482,414,545	709,530,277	
20,500,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	18,040,947	15,465,117	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	**ඒසීඒ - 2(II)**
19,056,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**17,121,531,160**	**17,629,294,784**	

					මූලධන වියදම්
63,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	51,004,128	21,095,483	
32,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	31,517,671	17,026,800	ඒසිඒ - 2(II)
-	ප්‍රාග්ධන පැවරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
17,000,000	හැකියා වර්ධනය	14	2,295,124	2,838,035	
100,000,000	වෙනත් මූලධන වියදම්	15	92,648,074	64,734,530	
212,500,000	**මුළු මූලධන වියදම් (උ)**		**177,464,997**	**105,694,848**	
	තැන්පතු ගෙවීම්		664,944,893	912,482,016	**ඒසිඒ -4**
	අත්තිකාරම් ගෙවීම්		385,346,482	135,843,013	**ඒසිඒ - 5/5(අ)**
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,050,291,375	1,048,325,029	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		18,349,287,532	18,783,314,661	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)		**(1,264,902,228)**	**(1,504,021,857)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

			ඒසිඒ -සි
2021 දෙසැම්බර් 31 දිනට			
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය			
			තත්‍ය
	සටහන	වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ -6	2,306,368,580	1,978,674,772
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ -5/5(ඒ)	730,368,739	714,108,653
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ -3	-	-
මුළු වත්කම්		**3,036,737,319**	**2,692,783,426**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		291,289,354	455,383,283
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		2,306,368,580	1,978,674,772
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ -5(ආ)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ -4	439,079,386	258,725,371
අග්‍රිම ශේෂය	ඒසිඒ -3	-	-
මුළු වගකීම්		**3,036,737,319**	**2,692,783,426**

පිටු අංක 138 සිට 140 දැක්වෙන ඉහත ඒසිඒ 1 සිට ඒසිඒ 6 දක්වා වූ අකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 141 සිට 144 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීමකර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී
එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

දිනය : 2022.

ගණන් දීමේ නිලධාරී

මේජර් ජෙනරල් එන්ආර් ලමාභේවාගේ (විශ්‍රා)
ආර්ඩබ්පී ආර්එස්පී එන්ඩියූ
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

දිනය : 2022.06.17

ප්‍රධාන ගණකාධිකාරී

ආර්. ආර්. බුලත්සිංහල
සිවිල් ආරක්ෂක
දෙපාර්තමේන්තුව

දිනය : 2022.06.17

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

එස්සිඒ-සි

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය **2021**	ඉකුත් වර්ෂය නැවත ගලපන ලද **2020**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	රු.	රු.
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදයම් නොවන ලැබීම්		
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්	1,625,982,850	1,704,160,365
අග්‍රිම ලැබීම්	15,870,000,000	16,347,250,000
අත්තිකාරම් අයකර ගැනීම්	367,836,993	112,084,265
තැන්පතු ලැබීම්	845,298,908	818,550,058
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**18,709,118,751**	**18,982,044,688**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	17,020,366,688	17,533,743,662
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	18,040,947	15,465,117
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	443,772,848	279,141,507
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	384,528,377	135,539,273
තැන්පතු ගෙවීම්	664,944,893	912,482,016
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**18,531,653,754**	**18,876,371,575**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ)-(ආ)	**177,464,997**	**105,673,113**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	--	--
ලාභාංශ	--	--
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	--	--
උපණය අය කර ගැනීම අත්තිකාරම් අය කර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-

<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	177,464,997	105,673,113
අත්තිකාරම් ගෙවීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**177,464,997**	**105,673,113**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(177,464,997)**	**(105,673,113)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7. මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	පොළිය	22,000	22,000	29,498	134%
20.03.99.00	විකුණුම් හා ගාස්තු	737,000	737,000	769,522	104 %
20.04.01.00	නිවාස කුලී	-	-	55	- %

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

				රු. ,000
ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	19,056,000	18,990,000	17,121,531	90.16%
ප්‍රාග්ධන	212,500	278,500	177,464	63.72%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

						රු. ,000
අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	වැටුප් හා දිමනා ගෙවීම	81,887	81,887	81,887	100%
02	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	වැටුප් පත්‍රිකා මුද්‍රණය	287	287	287	100%
03	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් දුම්රිය බලපත්‍ර වියදම්	949	949	949	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

					රු. ,000
වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	259,659	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	1,701,328	-	-
9153	ඉඩම්	-	284,669	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	60,711	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීර්එන්/ඒ/සිඑස්ඩී/2021/FA

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 1378 28 JUL 2022 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

ACCOUNTS BRANCH 3128/22 02 AUG 2022 DEPARTMENT OF CIVIL SECURITY

අධ්‍යක්ෂ ජෙනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව හා සහතික කළ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

පී.එල්.කේ පෙරේරා
අතිරේක විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
2. ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. +94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. +94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka. ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } DEF/A/CSD/2021/FA
ඔබේ අංකය உமது இல. Your No. }
දිනය திகதி Date } 2022 ජූලි 27 දින

අධ්‍යක්ෂ ජනරාල්,
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

(279)

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.

278

වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම. නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

277

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
2.2 (අ)	යම් නිලධාරියකුගේ සේවය අවසන් වනු ඇතැයි අපේක්ෂා කරන දිනට ප්‍රථමයෙන් ඔහුගේ සේවය අවසන් වුවහොත්, එවැනි නිලධාරින්ගෙන් අයවිය යුතු ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.3 වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට සේවය හැරගිය නිලධාරීන් 220 ක ගෙන් අයවිය යුතු රු. මිලියන 13.17 ක ණය ශේෂ හිඟ හිට තිබුණි. මෙම ණය ශේෂ වලින් වර්ෂ 03 ඉක්මවා ඇති ණය ශේෂවල වටිනාකම රු. මිලියන 9.4 ක් විය.	අදාළ ණය ශේෂ කඩිනමින් අය කර ගත යුතු වීම.
2.5 (ආ) iv	මුදල් රෙගුලාසි 770(4) හා770 (අ) (ආ) ප්‍රකාරව රාජ්‍ය ආයතනවල අබලන් වූ පාවිච්චි කල නොහැකි වාහන භඳුනා ගැනීම සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත්කළ යුතු අතර, එහිදී කාණ්ඩ 03 ක් යටතේ එනම් (i) සුන්බුන් ලෙස පවතින වාහන (ii) ධාවන තත්ත්වයේ නොපවතින හා අළුත්වැඩියාව ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන සහ (iii) ධාවන තත්ත්වයේ පවතින එහෙත් භාවිතය ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන හා/ හෝ වෙනත් විශේෂ කරුණු මත අපහරණය සඳහා හඳුනාගත් වාහන ලෙස වර්ග කළ යුතුය. නමුත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ධාවනයට අයෝග්‍ය බවට තීරණය කර ඇති වාහන 25 ක ලේඛනයක් ලැයිස්තු ගත කර තිබුණු අතර, 2020 වර්ෂයේ හෝ ඊට පෙර ධාවනයෙන් ඉවත් කළ වාහන මෙම ලේඛනයේ පැවතුණද, යථෝක්ත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කාණ්ඩගත කිරීමක් හෝ විගණන අවස්ථාව දක්වා එම වාහන තක්සේරු කර අපහරණය කිරීමට හෝ කටයුතුකර නොතිබුණි.	අදාළ මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වීම.

(276)

2.5(ආ) v	මුදල් රෙගුලාසි 880 හා 891 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු විධායක තනතුරු 06 කට සහ ද්විතීක තනතුරු 03 කට අදාළ නිලධාරීන් ඇප තබා නොතිබුණි.	අදාළ මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වීම.
2.5(ආ) viii	මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන භාර නිලධාරී විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව, ඒ ඒ වාහනයේ වර්ගය හා මෝස්තරයද ලියාපදිංචි කිරීම් අංකයද, තමන්ට භාරදුන් දිනයද, පැවරූ දිනය හා ඒ පිළිබඳව විස්තරද, වෙනත් නිසි තොරතුරුද දැක්වෙන වාහන ලැයිස්තුවක් තබා ගත යුතු වුවද, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යන වාහන ලේඛනයේ වාහන අංකය, වාහන වර්ගය, දක්වා තිබුණද භාරදුන් දිනය හෝ පැවරූ දිනයද එක් එක් වාහනය සඳහා දක්වා නොතිබුණි.	අදාළ මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වීම.
2.5 (ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වාහන 426 කට හා යතුරුපැදි 205 කට අදාළව සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂවල ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර, ප්‍රවාහන අංශය විසින් තීරණය කරනු ලබන ඉන්ධන දහනයවීම් ප්‍රමාණයන් අනුව ධාවන සටහන් වල ඉන්ධන තුලනය කිරීම් සිදුකර තිබුණි.	අදාළ චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම.
3.3 (අ)	ආරක්ෂක අමාත්‍යාංශයට අයිති වාහන 11 ක් හා යතුරුපැදි 16 ක්, ජනාධිපති කාර්යාලයට අයත් වාහන 3 ක්, ප්‍රසම්පාදන අමාත්‍යාංශයට අයත් වාහන දෙකක් සහ පාර්ලිමේන්තු කාර්යාලයට, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට, සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහනය බැගින්, එකතුව වාහන 19 ක් හා යතුරුපැදි 16 ක් දෙපාර්තමේන්තුව දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින අතර, මෙම වාහන වල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	කඩිනමින් නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.

275

3.5 (ඊ)	සේවා වනිතා සංගමය විසින් දෙපාර්තමේන්තුවේ සාමාජිකයින්ගේ දරුවන්ට අභ්‍යාස පොත් නිෂ්පාදනය කර බෙදා හැරීම සඳහා කන්තලේ බලකායේ හටයින් 239 දෙනෙකු මාස 3 ½ කට අධික කාලයක් යොදවාගෙන තිබුණු අතර, මෙම කාලපරිච්ඡේදය තුළ අදාළ හටයින් සඳහා ගෙවා තිබුණු රු.මිලියන 45.1 ක වැටුප් පිරිවැය ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.	අදාළ වැටුප් පිරිවැය දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කර ගත යුතු වීම.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 ආදායම් ලැබීම්

රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී, කෘෂි සත්ත්ව හා වෙනත්, සංගීත හා නර්තන, ආරක්ෂක සේවා, ඉදිකිරීම් හා නඩත්තු සේවා යන ආදායම්වලින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සැලකිය යුතු ආදායමක් රැස්කරන අතර, සමාලෝචිත වර්ෂයේදීද එම ආදායම් ප්‍රභවයන්ගෙන් එකතුව රු. මිලියන 769.58 ක ආදායමක් රැස්කර තිබුණි. වාර්ෂිකව උපයනු ලබන මෙම ආදායම් ගිණුම් ගත කිරීමට සමාලෝචිත වර්ෂයේද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.6.1.2 හිඟ ආදායම්

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට සපයනු ලැබූ ආරක්ෂක හා වෙනත් සේවාවන් ඉටුකර දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු එකතුව රු. මිලියන 18.31 ක හිඟ ආදායම් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. මෙම අයකර ගත යුතු හිඟ ආදායම් වලින් රු. මිලියන 6.38 ක් පසුගිය වර්ෂයේ හිඟහිටි ශේෂ වන අතර, මීට වර්ෂ කිහිපයකට පෙර සපයනු ලැබූ සේවාවන් වෙනුවෙන් අයවිය යුතු ශේෂයන්ද පැවතුණි.

274

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

1.6.2.1.1 ශේෂ අතර නොසැසඳීම්

වෙනත් යන්ත්‍ර සහ උපකරණ යටතේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණු වර්ෂ අවසාන ශේෂයේ එකතුව රු. මිලියන 914.14 ක් වූ අතර, එම වත්කම්වලට අදාළව විගණයට ලබා දී ඇති තොරතුරු අනුව වර්ෂ අවසාන ශේෂය රු.මිලියන 112.1 ක් වූයෙන් රු. මිලියන 802.04 ක වෙනසක් පැවතුණි.

1.6.2.1.2 ලේඛනගත වී හෝ ගිණුම්ගත වී නොතිබුණු වත්කම්

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන යායුතු වුවද, දෙපාර්තමේන්තුවට අයිති බිම් කැබලි 41 කට අදාළ ඉඩම් හෙක්ටයාර 72.05 ක්, වර්ග අඩි 134,955 කට අදාළ ගොඩනැගිලි 118 ක්, මඟී වාහන 12 ක් , කෘෂි කාර්මික වාහන 203 ක් , කාර්මික වාහන 19 ක් හා යතුරුපැදි 205 ක්, සමාලෝචිත වර්ෂය අවසන්වන විටද, තක්සේරුකර ස්ථාවර වත්කම් ලේඛනවලට ගෙන මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. මේ නිසා එම වත්කම්වල වටිනාකමට සමාන ප්‍රමාණයකින් දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් ඌණ ගණනය වී තිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

රජයේ නිලධාරීන් ලබාගෙන ඇති ණය හා අත්තිකාරම් වෙනුවෙන් සීසී-10 ලේඛනයක් පවත්වාගෙන නොතිබුණු අතර, පරිගණක පැතුරුම්පතක් ආධාරයෙන් ණය ශේෂ සහ අයකිරීම් සටහන් කර තිබුණි.

278

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.1.1 ඇස්තමේන්තු පිළියෙල කිරීම

මු.රෙ.50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක්දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවත්, පහත සඳහන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු පැවතුණි.

(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

විදේශීය ගමන් වියදම් සඳහා වැය විෂය 320-1-01-1102 යටතේ සලසාගෙන තිබුණු රු. මිලියන 1.5 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිකර තිබුණි.

(ආ) ප්‍රතිපාදන ඌණ උපයෝජනය

මූලධන වැය විෂයයන් පහක් සඳහා එකතුව රු. මිලියන 246.5 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 100.55 ක ප්‍රතිපාදන ද, පුනරාවර්තන වැය විෂයයන් 17 ක් සඳහා එකතුව රු. බිලියන 6.89 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. බිලියන 1.41 ක ප්‍රතිපාදන ද, උපයෝජනය නොකිරීම නිසා ඉතිරිකර තිබුණු අතර, එම ඉතිරිකිරීම් ප්‍රමාණය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 83 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) වෙන්කරගෙන තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ අතිරික්ත වීම

පුනරාවර්තන වැය විෂයන් හතරක සහ මූලධන වැය විෂයක සලසා තිබුණු ප්‍රතිපාදන අතිරික්තවීම නිසා මු.රෙ. 66 මඟින් පිළිවෙලින් රු. මිලියන 106 ක් සහ රු. මිලියන 11 ක් වෙනත් වැය විෂයන් වලට මාරුකරගෙන තිබුණු අතර, මෙසේ ප්‍රතිපාදන මාරුකර නොගත්තේ නම්, සලසාගෙන තිබුණු ප්‍රතිපාදන වලින් ඉතිරිවීම් ප්‍රමාණය තවදුරටත් ඉහල යන බවද නිරීක්ෂණය කෙරේ.

272

2.1.2 පරිපූරක ඇස්තමේන්තු මඟින් ලබා දුන් ප්‍රතිපාදන ඉතිරි කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මු.රෙ. 66 මාරු කිරීම යටතේ මාරු කරගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කිරීම

පුනරාවර්ථන වැය විෂයක් හා මූලධන වැය විෂයක් සඳහා මු.රෙ 66 යටතේ පිළිවෙලින් මාරුකර ගෙන තිබුණු රු. මිලියන 4 ක හා රු. මිලියන 72 ක සම්පූර්ණ ප්‍රතිපාදනයන්ම වර්ෂ අවසානයට ඉතිරිකර තිබුණි.

(ආ) මු.රෙ. 66 යටතේ මාරු කරගත් ප්‍රතිපාදන ඌණ උපයෝජනය

මූලධන වැය විෂයක්ද ඇතුළුව වැය විෂයන් 03 ක් සඳහා මු.රෙ. 66 යටතේ එකතුව රු. මිලියන 41 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණු අතර, මෙම මාරු කරගත් ප්‍රතිපාදන වලින් එකතුව රු. මිලියන 13 ක් හෙවත් සියයට 32 ක් වර්ෂ අවසානයට ඉතිරිකර තිබුණි.

2.2 රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ

යම් නිලධාරියකුගේ සේවය අවසන් වනු ඇතැයි අපේක්ෂා කරන දිනට ප්‍රථමයෙන් ඔහුගේ සේවය අවසන් වුවහොත්, එවැනි නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.3 වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ සේවය හැරගිය නිලධාරීන් 75 දෙනෙකුගෙන් එකතුව රු. මිලියන 3.25 ක විශේෂ අත්තිකාරම්, උත්සව අත්තිකාරම් හා ආපදා ණය හිඟ හිට තිබුණු අතර, මෙම ණය ශේෂ අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි. තවද, සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ කිහිපය තුළදී සේවය හැරගොස් තිබුණු නිලධාරීන්/සේවකයින් හතර දෙනෙකුට අදාළ එකතුව රු. 605,466 ක් වූ අයවිය යුතු ආපදා ණය ශේෂ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ ලෙස දක්වා තිබුණි. තවද, සේවය හැරගොස් තිබුණු නිලධාරියකුගෙන් අයවිය යුතු රු.133,550 ක ණය ශේෂය ගිණුම්වලින් මහහැරී තිබුණි.

(271)

(ආ) විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ

සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ කිහිපය තුළදී විශ්‍රාම ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් හා මියගිය නිලධාරීන් .19 දෙනෙකුගෙන් පිළිවෙලින් අයවිය යුතු රු. මිලියන 2.03 ක හා රු. මිලියන 2.57 ක අයවිය යුතු ආපදා ණය ශේෂ ගිණුම් වලින් මහහැරී තිබුණු අතර, මෙම ණය ශේෂ පිළිබඳව කාල විශ්ලේෂණයන් ලබාදීමට හෝ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2 හා 4.4 වගන්තිවල දැක්වෙන විධිවිධාන පරිදි අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද, ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද ඇමුණුම් 3.5 යටතේ විශ්‍රාම ගිය නිලධාරීන් 37 දෙනෙකුගේ එකතුව රු. 516,260 ක් වූ ආපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ මාස 03-12 තීරුවට ඇතුළත්කර තිබුණද, වර්ෂය ඉක්මවා ගිය ණය ශේෂද ඒ අතර පැවතුණි.

(ඇ) සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ

2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිලධාරීන් 67 දෙනෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 9.77 ක ආපදා ණය ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 255 දෙනෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 1.17 ක උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ වශයෙන් එකතුව රු.මිලියන 10.94 ක ණය හා අත්තිකාරම් ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 බැරකම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හෙළිදරව් නොකළ බැරකම්

මූල්‍ය ප්‍රකාශනවලින් රු. මිලියන 140.16 ක බැරකම් අනාවරණය කර නොතිබුණි.

(ආ) බෙරුම් නොකළ බැරකම්

වැය විෂයයන් 15 කට අදාළ රු. මිලියන 142.69 ක බැරකම් 2022 මාර්තු 31 දින වන විටත් බෙරුම් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව තිබුණි.

(ඇ) මාසය ඉක්ම වූ බැරකම්

මූදල් රෙගුලාසි 94(1) හා 214 ප්‍රකාරව පනවා ඇති නියමයන් අනුව කටයුතු නොකිරීම නිසා මසකට වැඩි බැරකම් අයිතම 51 ක් වූ අතර, එහි වටිනාකම රු. මිලියන 2.1 ක් විය.

270

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
මුදල් රෙගුලාසි 104(3) (4)	දෙපාර්තමේන්තුවේ වාහනයකට සිදු වූ රිය අනතුරකට අදාළව ප්‍රාරම්භක හෝ පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
මුදල් රෙගුලාසි 396 (ඇ)	නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ රු. 569,311 ක් වටිනා වෙක්පත් 39 ක් සම්බන්ධයෙන් අදාළ රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.
මුදල් රෙගුලාසි 770(4) හා 770 (අ) (ආ)	සමාලෝචිත වර්ෂයේ ධාවනයෙන් ඉවත් කළ වාහනයක් තක්සේරු කර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
මුදල් රෙගුලාසි 1645(අ)	දෙපාර්තමේන්තුවේ වාහන 17 කට අදාළව ලොග් සටහන් පොත් පවත්වා තිබුණද, අත්‍යාවශ්‍ය තොරතුරු යාවත්කාලීනව වාර්තා කර නොතිබුණි.

2.5 අවිධිමත් ගණුදෙනු

දෙපාර්තමේන්තුවේ සේවය කර, සමාලෝචිත වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල සේවය හැර ගිය, විශ්‍රාමගිය හෝ මියගිය සේවකයන්/ නිලධාරීන් 442 කු හට ඔවුන් තවදුරටත් සේවයේ නියුතු වූවන් ලෙස සලකා එකතුව රු. මිලියන 10.08 ක් වැටුප් ලෙස ගෙවා තිබුණු අතර, මෙම ගෙවීම්වලින් රු. මිලියන 2.36 ක් පමණක් ආපසු අයකර තිබුණි.

269

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුමක 2020 වර්ෂයේ සිට පැවතුණු එකතුව රු. මිලියන 23.79 ක හඳුනානොගත් ලැබීම් ශේෂය හඳුනාගෙන නිසිපරිදි ගිණුම්ගත කරනු වෙනුවට තැන්පත් ගිණුමකට මාරුකර තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යය භාරයන් ඉටුකිරීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව රාජ්‍ය ආයතන 350 කට ආරක්ෂාව සැලසීමට සැලසුම්කර තිබුණද, රාජ්‍ය ආයතන 99 කට පමණක් ආරක්ෂාව සලසා තිබුණු අතර, ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 28 කට සීමා වී තිබුණි. තවද, පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම, ඩෙංගු මර්ධනය, කෙරෝනා පාලනය, පොලිස් රාජකාරී සඳහා සහායදීම සහ නගර අලංකරණය යන ව්‍යාපෘතිවල ඉලක්කයන් ප්‍රමාණාත්මකව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොමැති අතර, මේ නිසා එම මෙහෙයුම්වල කාර්යසාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය.

3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍ය දැක්ම සංකල්පයට අනුව කෘෂි වගාව නගාසිටුවීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ කැබිතිගොල්ලෑව බලකායට අදාළව අක්කර 20 ක භූමි ප්‍රමාණයක හරිතාගාර (Green House) මිරිස් වගා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමට රු. මිලියන 17.67 ක් ද ඇතුලුව, එකතුව රු. මිලියන 18.37 ක මුදලක් වැයකර තිබුණු අතර, නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව මෙම වියදම් දැරීම නිසා ව්‍යාපෘතිය මෙතෙක් ආරම්භ කිරීමට හෝ නොහැකිව අසාර්ථක වී තිබුණි.

3.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගත් ව්‍යාපෘති

දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම සිවිල් ආරක්ෂක හටයින් යොදවා ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිවලින් විගණන නියැදි පරීක්ෂාවක් ලෙස කතරගම, මොණරාගල, අම්පාර, උහන හා මහඔය බලකා මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඉදල්, ඉරටු, මල් පෝච්චි, ගඩොල්, දියර කිරි, පත්තර කවර, මැහුම්, කොසු, විසිතුරු මසුන්, මැටි භාණ්ඩ, රස කැවිලි හා දුම් කරවල යන ව්‍යාපෘති පරීක්ෂා කළ අතර, අදාළ ව්‍යාපෘතිවලින් මෙම කාලපරිච්ඡේදය තුල වියදම ඉක්මවා රු. මිලියන 8 ක ආදායමක් වාර්තා කර ඇතත්, අදාළ ව්‍යාපෘති සඳහා යොදවා ඇති හට

(268)

පිරිස්වල වැටුප් පිරිවැය සළකා බැලුවහොත් ලබා තිබුණු ආදායම ඉක්මවූ වියදම රු. මිලියන 76.5 ක් වී තිබුණි. අදාළ ව්‍යාපෘති සඳහා අමුද්‍රව්‍ය ලබාගත් බිල්පත්/ලේඛන මෙන්ම නිෂ්පාදිතයන් අලෙවි කිරීමෙන් ලද ආදායම් ලේඛනද නොතිබුණු නිසා සත්‍ය නිෂ්පාදනයක් සිදුවී තිබේද යන්න හෝ අදාළ ව්‍යාපෘති සත්‍ය වශයෙන් ක්‍රියාත්මක කර තිබේද යන්නද ගැටලු සහගත විය. තවද, වැටුප් පිරිවැය සලකා බැලීමේදී බොහෝමයක් ව්‍යාපෘති පිරිවැය අතින් ඵලදායී නොවන බැවින්, ඵලදායී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත අරමුණුවලට ලහාවීමට ඇති හැකියාව පිළිබඳව ඉහළ කළමණාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

3.2.1 ප්‍රසම්පාදන සැලැස්ම

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ 4.2.1 (අ) සහ (ආ) මාර්ගෝපදේශයන් පරිදි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

(ආ) 4.2.1 (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි දෙපාර්තමේන්තුව 2021 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 799 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි රු. මිලියන 167 ක් වැයකර ප්‍රසම්පාදනය කර ගන්නා භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයන් දක්වා නොතිබුණි.

3.2.2 සමාලෝචිත වර්ෂයේ සිදුකළ ප්‍රසම්පාදනයන්

දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය හා සීමිත/පාලිත ජාතික තරහකාරී ලංසු ක්‍රමය යටතේ සිදුකර තිබුණු රු. මිලියන 65 ක ප්‍රසම්පාදනයන් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා ඇති බවට විගණනයට කරුණු වාර්තාකර ඇති අතර, බොහෝ අවස්ථාවල ආයතන විශාල ප්‍රමාණයකගෙන් මිල ගණන් ඉල්ලා තිබුණද, ලැබී තිබුණු මිල ගණන් සංඛ්‍යාව ඉතා අඩු ප්‍රමාණයක පැවතුණු අතර, මිල ගණන් ඉල්ලුම් ලේඛන ලංසුකරුවන්ට යැවූ බවට තැපැල් කුවිතාංසි හෝ විද්‍යුත් පණිවිඩ සනාථන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ලංසු ලියාපදිංචි තැපෑලෙන් ලද ඒවාද, ටෙන්ඩර් පෙට්ටියට බහාලූ ඒවාද යන්න විගණනයට අනාවරණය නොවුණු අතර, ලියාපදිංචි තැපෑලෙන් ලද ලංසු සම්බන්ධයෙන්

247

ලියාපදිංචි තැපැල විවෘත කළ ලේඛන හෝ ටෙන්ඩර් පෙට්ටිය විවෘත කිරීමේ ලේඛන පවත්වා නොතිබුණි.

(ඇ) ලියාපදිංචි සැපයුම්කරුවන් අතරින් මිල ගණන් විමසූ සැපයුම්කරුවන් තෝරාගත් පදනම විගණනයට අනාවරණය නොකෙරුණි.

(ඈ) ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි ඇතැම් සැපයුම්කාර ආයතන විවිධ ව්‍යාපාර නම්වලින් පෙනී සිටියද එකම අයිතිකරුවන් පිරිසකට අයිති බවට විගණනයට කරුණු අනාවරණය වී ඇති අතර, මෙම තත්ත්වය මහජන තරඟය සීමා කිරීමට බලපා තිබුණි. තවද, ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් බැහැරව විකල්ප ලංසු කැඳවීමේ අවස්ථාවන්ද සොයා බලා නොතිබුණි.

(ඉ) තාක්ෂණික ඇගයීම් කමිටු හා ලංසු විවෘත කිරීමේ කමිටු පත්කිරීමේ ලිපි ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) විවිධ ශකාතාවයන් ඇති භාණ්ඩ හා උපකරණ සඳහා එකම නිලධාරීන් කණ්ඩායමකින් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටු සහභාගී වී තිබුණු අතර, 2.8.1 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව විෂය පිළිබඳ විශේෂඥයෙකුගෙන් සහ ප්‍රසම්පාදන කාර්යපටිපාටි පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති අවම වශයෙන් එක් නිලධාරියෙකුගෙන් තාක්ෂණික ඇගයීම් කමිටු සමන්විත වූයේද යන්නද විගණනයට තහවුරු නොවුණි.

(උ) 6.3.3 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු විවෘත කිරීම විනිවිදභාවයකින් යුක්තව ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී සිදුකර නොතිබුණි.

3.2.2.1 හරිතාගාර (Green House) මිරිස් වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනය

යටෝක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලිපිගොනු 11 යටතේ රු.මිලියන 17.67 ක් වැයකර භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනය කරගෙන තිබුණු අතර, මෙම ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පොදුවේ නිරීක්ෂණය කරන කරුණු පහත දැක්වේ.

(අ) මෙම ප්‍රසම්පාදන කටයුතුවලට අදාළව ලංසු විවෘත කිරීම්, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයන් ලබාදීම්, ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාදීම් හා භාණ්ඩ ඇණවුම් කිරීම් වැනි ප්‍රසම්පාදන කටයුතුවලට පෙර ගබඩාවට භාණ්ඩ ලැබී තිබුණු අතර විගණනය නොමඟ යැවීම සඳහා මිලදී ගැනීමෙන් පසු ඒවා නිත්‍යානුකූල බවට තහවුරු කිරීමට ලිපි ලේඛන සකස්කර තිබුණි. මෙම තත්ත්වය මත 1.1 හා 1.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව

266

ප්‍රසම්පාදනයෙන් රජය අපේක්ෂා කරන පරමාර්ථ හා අරමුණු ඉටුකරගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) මිලදී ගත් උපකරණ හා භාණ්ඩ නිශ්කාර්යව වර්ෂයකට අධික කාලයක් කැබිතිගොල්ලෑව බලකායේ ගබඩාකර තිබුණි

(ඇ) ඇතැම් භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනය කරගැනීමේදී භාණ්ඩ සැපයීම සඳහා ලංසු කරුවන් විසින් ලබා දී ඇති කාල පරිච්ඡේදයන්ට (බොහෝ විට මාසයේ සිට මාස දෙක දක්වා) පෙර ඉතා ඉක්මණින් අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගැනීමට කටයුතු කිරීම නිසා ප්‍රසම්පාදන ලිපිගොනු හතරක් යටතේ රු. මිලියන 3. 23 ක මුදලක් වැඩිපුර වැයකර මිලදී ගත් භාණ්ඩ හා උපකරණ වර්ෂයකට අධික කාලයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) මිල සැදහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීමේදී, 2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කාර්ය සංග්‍රහය ප්‍රකාරව ලබා ගතයුතු අවම මිල ගණන් ප්‍රමාණය ලබාගෙන නොතිබුණි.

මෙම නිරීක්ෂණවලට අමතරව එක් එක් භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් වන විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

	මිලදීගත් ද්‍රව්‍ය	වැයකළ මුදල (රු.)	විගණන නිරීක්ෂණ
I	Rotavator 02 ක්	2,778,900	3.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් නිර්ණායකයන් සපුරනු නොලැබුවද සීමිත/පාලිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය භාවිතාකර තිබුණු අතර, පිරිවිතර ලේඛනය කවුරුන් විසින් පිළියෙල කළේද යන්න අත්සනක් තබා නොතිබුණි. පිරිවිතර ලේඛන ලංසුකරුවන් වෙත ලබාදුන් බවට කරුණු සනාථ වී නොමැති අතර, ලංසු විවෘත කිරීම එක් සාමාජිකයෙකු විසින් සිදුකර තිබුණි. තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූල අඩු මිල ලංසුකරු ප්‍රතික්ෂේපකර රු.මිලියන 1.98 ක වැඩි මිලකට ප්‍රසම්පාදනය කරගෙන තිබුණු අතර, මිලදී ගෙන නිශ්කාර්යව තැබීම නිසා වර්ෂයක නිදහස් වගකීම් කාලයද මේ වන විට අවසන්ව තිබුණි.
II	INSECT	4,995,000	පිරිවිතර අවශ්‍යතා සැපිරූ තායිවාන නිෂ්පාදනයක් හා

265

	PROOF NET – Mesh Size 40 Roll width 3 m Roll Length 100 m		රීශ්‍රායලයේ නිෂ්පාදනයක් සඳහා පිළිවෙලින් පළමු හා දෙවන අඩු මිල ගණන් හේතු නොදක්වා බැහැරකර තිබුණු අතර, රු. 58,000 ක වැඩි පිරිවැයක් දරා ප්‍රසම්පාදනය කරගෙන තිබුණි. තවද, තාක්ෂණික ඇගයීම් කමිටු සභාපති හා සාමාජිකයකු තාක්ෂණික ඇගයීම් කමිටු තීරණවලට එකඟතාවය පළකර අත්සන් කර නොතිබුණි.
III	UV Resistant Mulch Film – film Thickness 40 micron Roll width 1.2 m Roll Length 400 m Colour Silver & Black	2,550,000	3.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් නිර්ණායකයන් පිළිබඳ නොසලකා සීමිත/පාලිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය භාවිතාකර තිබුණු අතර, පිරිවිතර ලේඛනයක් සකස්කර නොතිබුණි.
IV	ගොඩනැගිලි ද්‍රව්‍ය	1,670,512	3.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් නිර්ණායකයන් පිළිබඳ නොසලකා සීමිත/පාලිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය භාවිතාකර තිබුණු අතර, 8.9.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.
V	Drip Tape & Accessories	2,557,940	භාණ්ඩ ඇණවුම 2021 ජූලි 06 නිකුත්කර තිබුණු අතර, එදින සිට දින 07 ක් ඇතුලත අදාළ උපකරණ භාරදිය යුතු බව දක්වා තිබුණද, කොන්ත්‍රාත් ගිවිසුමේ භාණ්ඩ භාරදිය යුතු කාලපරිච්ඡේදය ඊට පරස්පරව ජූලි 22-29 ලෙස දක්වා තිබුණි.
VI	Spray Machine, GI	2,087,532	සැපයුම්කරුගෙන් රු. 427,388 කට Hazmat Suit Disposable Protective Coverall 09 ක් සහ Taiwan

(264)

Pipe, Coated wire	GI Pipes 2" – 1.6 mm 90 ක් මිලදී ගැනීමට ඇණවුමක් නිකුත්කර ඇතත්, 8.9.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි ගිවිසුම්ගත වීමක් සිදුකර නොමැති අතර, අදාළ තොග ඇණවුම්කර මාස 06 කට අධික කාලයක් ගතවී තිබුණද, මෙතෙක් සපයා නොතිබුණි.

3.2.2.2 සමාලෝචිත වර්ෂයේ සිදු කළ අනෙකුත් ප්‍රසම්පාදනයන්

සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් මිල සැඳැහුම් ක්‍රමය, ජාතික තරඟකාරී ලංසු ක්‍රමය සහ සීමිත/පාලිත ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමයන් අනුගමනය කරමින් සිදුකර තිබුණු අතර රු.මිලියන 47.32 ක ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

	මිලදී ගත් ද්‍රව්‍ය	වැයකළ මුදල (රු.)	විගණන නිරීක්ෂණ
I	කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කළු පොලිතීන් කි.ග්‍රෑ 13,000 ක්	9,827,672	2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලබා ගත යුතු අවම ලංසු ප්‍රමාණය ලබා ගෙන නොතිබුණු අතර, 5.6 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවිතර ලේඛනයක් සකස්කර නොතිබුණි. තවද, 2.8.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව විෂය විශේෂඥයෙකු සහ ප්‍රසම්පාදන කාර්යපටිපාටිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති සාමාජිකයන්ගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත වී නොතිබුණි. තවද, පොලිතීන් පිළිබඳව තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබානොගෙන තත්ත්වයෙන් උසස් බව නිර්දේශකර වැඩි මිල ඉදිරිපත් කළ ලංසුකරුවකුගෙන් රු. මිලියන 4.12 ක අමතර වැයබරක් දරා අදාළ පොලිතීන් තොගය මිලදී ගෙන මාස 05 කට අධික කාලයක් ගතවී ඇතත්, මේ වන විටත් රු. මිලියන 9 ක් වටිනා පොලිතින් කිලෝ ග්‍රෑම් 12, 862 ක් හෙවත් මුළු තොගයෙන් සියයට 99 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(268)

II	Band Uniform Caps සහ Leather Gates (Brown Colors) 241 බැගින්.	1,325,475	පිරිවිතර ලේඛනයක් සකස්කර නොතිබුණු අතර, 2.8.1 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව විෂය විශේෂඥයෙකු සහ ප්‍රසම්පාදන කාර්යපටිපාටිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති සාමාජිකයන්ගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත වී නොතිබුණි. තවද, 7.7 (ඇ) මාර්ගෝපදේශයට පටහැනිව ලංසු ලේඛනවලින් ඉල්ලා නොතිබුණු ''ආදර්ශක'' ප්‍රධාන නිර්නායකයක් කරගනිමින් සැපයුම්කරු තෝරාගෙන තිබුණි.
III	වැලිසර උප බලකාය සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය	1,727,059	මිල ගණන් ඉල්ලුම් කිරීම සඳහා නියමිත විෂය කාණ්ඩයේ ලියාපදිංචි සැපයුම්කරුවන් තෝරානොගෙනීම නිසා නැවත පිරිවැයක් දරමින් ප්‍රසම්පාදන කටයුතු කිරීමට සිදුව තිබුණු අතර, ඇස්තමේන්තුව සියයට 81 කින් ඉක්මවා තිබුණි.
IV	ටයර් වර්ග 38 කට අදාළ ටයර් 408 ක් , ටියුබ් වර්ග 23 කට අදාළ ටියුබ් 345 ක් හා කොලර් වර්ග 03 කට අදාළ කොලර් 187 ක්	9,384,501	පිරිවිතර ලේඛනයක් සකස්කර නොතිබුණු අතර, 5.3.1 (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි ලංසු ලේඛන අනුමතකර නොතිබුණි. තවද, ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ලේඛන කැඳවා නොතිබුණු අතර, 2.8.1 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව විෂය විශේෂඥයෙකු සහ ප්‍රසම්පාදන කාර්යපටිපාටිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති සාමාජිකයන්ගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත වී නොතිබුණි. තවද, 7.7 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව ලංසු ලේඛනයේ නිශ්චයකොට දක්වා නොමැති ඇගයීම් සාධක ලංසු ඇගයීමේදී භාවිතාකර පක්ෂපාතීව සැපයුම්කරු තෝරාගෙන තිබුණු අතර, මුළු තොගයම තනි සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගැනීමේ ක්‍රමය වෙනුවට ඒකක අවම මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් තෝරාගත්තේනම් රජයට රු. 632,378 ක මුදලක් ඉතිරිකර ගත හැකිව තිබුණි.

26 ව

V	පෙරපාසල් ගුරුවරියන් සඳහා සාරි 3999 ක්	6,598,360	2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලබා ගත යුතු අවම ලංසු ප්‍රමාණය ලබා ගෙන නොතිබුණු අතර, සාරි තොගයේ වගකීම් කාලය මාස 06 ක් වුවද, 2022 අප්‍රේල් 19 දින විගණනයෙන් පරීක්ෂා කරන විට ගබඩාවට ලැබී මාස 07 ක් ගතවූ රු.මිලියන 1.3 ක් වටිනා සාරි 854 ක් පැවති අතර, මෙම තොගවල වගකීම් කාලයද ඉක්මවා මසකට අධික කාලයක් ගත වී ඇතත් බෙදාහැරීම් නිශ්කාර්යව ගබඩා කර තිබුණි. තවද, ගබඩාවට ලැබී මාස 02 ක් ගතවූ රු. 770,001 ක් වටිනා සාරි 504 ක් ද බෙදාහැර නොතිබුණි.
VI	පෝසිලීන් භාණ්ඩ	1,144,669	මිල ගණන් ඉල්ලා නොමැති ලංසුකරුවකු මිල ගණන් එවා තිබුණු අතර, මිලදී ගැනීමේදී පිරිවැය ඇස්තමේන්තුව රු. 784,769 කින් හෙවත් සියයට 218 කින් ඉක්මවා තිබුණි.
VII	LED Light For All Sector Office and Training Camp	9,451,271	2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කාර්ය සංග්‍රහය ප්‍රකාරව ලබාගත යුතු අවම ලංසු ප්‍රමාණය ලබා ගෙන නොතිබුණු අතර, 7.7 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු නොකර ලංසු ලේඛනයේ නිශ්චය කොට දක්වා නොමැති ඇගයීම් සාධක ලංසු ඇගයීමේදී භාවිතාකර පක්ෂපාතීව සැපයුම්කරු තෝරාගෙන තිබීම නිසා රු.මිලියන 3.09 ක වැඩි පිරිවැයක් දරා මිලදී ගැනීමට සිදු වී තිබුණි.
VIII	මියාගෝ ආසිම් ට්‍රැම්ප්‍රීඩ් කෘමිනාශක 200 මි.ලි ඒකක 567 ක්	1,127,175	ඇස්තමේන්තුව ඉක්මවා සියයට 198 ක් වැයකර තිබුණු අතර, 2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කාර්ය සංග්‍රහය ප්‍රකාරව ලබා ගත යුතු අවම ලංසු ප්‍රමාණය ලබා ගෙන නොතිබුණි. තවද, 6.3.3 (අ) මාර්ගෝපදේශයෙන් බැහැරව ලංසු විවෘත කිරීමට එක් නිලධාරියෙකු පමණක් සහභාගී වී තිබුණි.

(261)

IX	Canon Toner වර්ග 09 ක්	4,741,466	මිලදී ගැනීම් සිදුකිරීමෙන් පසුව ව්‍යාජ ලෙස අදාළ ප්‍රසම්පාදන කමිටු වාර්තා ඇතුළු ලේඛන පිළියෙල කර තිබුණි.
X	ගොඩනැගිලි ද්‍රව්‍ය	1,991,158	2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කාර්ය සංග්‍රහය ප්‍රකාරව ලබාගතයුතු අවම ලංසු ප්‍රමාණය ලබාගෙන නොතිබුණු අතර, ආයතන 10 කින් මිල ගණන් ඉල්ලා ඇතත්, ලැබී තිබුණේ එක් ලංසුවක් පමණක් වීම හේතුවෙන් දෙවනවරට මිල ගණන් කැඳවීමට තීරණය කළද, එම අවස්ථාවේදීද පළමුවරට මිල ගණන් ඉල්ලුම්කළ ආයතන 07 න් මිල ගණන් ඉල්ලුම් කිරීම නිසා එම අවස්ථාවේදී ද ලැබී තිබුණු එක් ලංසුවක් මත පදනම්ව තරඟකාරීත්වයෙන් බැහැරව මිලදී ගෙන තිබුණි.

3.2.2.3 වාහන අලුත්වැඩියා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 9.3.1 (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැරව රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුවට අයිති අංක JS – 6144 හා 65 – 4873 දරන රථ දෙක පිළිවෙලින් රු.2,450,000 ක් සහ රු. 2,400,000 ක් ලෙස එකතුව රු.4,850,000 ක වියදමකින් අලුත්වැඩියා කිරීමට පුද්ගලික ගරාජයකට යොමුකර තිබුණු අතර, ලංසු විවෘත කිරීම ලංසුකරුවන් දැනුවත් කිරීමකින් තොරව කමිටු සාමාජිකයින් දෙදෙනෙකුගේ පමණක් සහභාගීත්වයෙන් සිදුකර තිබුණි. දින 14 ක් තුළ අලුත්වැඩියාව සිදුකර දීමේ එකඟතාවයමත අලුත්වැඩියාවට භාරදුන්නද මේ වන විට වසර 03 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද, අලුත්වැඩියාවන් නිමකර නොතිබුණු අතර, මෙම තත්ත්වය අදාළ රථවල ආරක්ෂාවටද තර්ජනයක් වී තිබුණි. තවද, 8.9.1 මාර්ගෝපදේශ ප්‍රකාරව අදාළ ආයතනය සමඟ ගිවිසුම් ගතවීමක්ද සිදුකර නොතිබුණි.

(ආ) අංක 55-5663 දරන කැබ් රථය රු. 40,180 ක වියදමින් අලුත්වැඩියාවේදී 2.8.1 (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙන් බැහැරව, ප්‍රසම්පාදන සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල සභාපති ලෙස එකම නිලධාරියෙකු කටයුතුකර තිබුණි.

2.60

3.2.2.4 කතරගම බලකා මූලස්ථානයේ සෙසු නිල නිවාඩු නිකේතන ගොඩනැගිල්ල ඉදිකිරීම

ශ්‍රම පිරිවැය හැර රු.මිලියන 11.13 ක වියදමකින් ඉදිකර තිබුණු යටෝක්ත ගොඩනැගිල්ල පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර අදාළ පලාත් පාලන ආයතනයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, අනුමැතිය ලබා ගැනීමෙන් පසුව අනුමැතියකියන් තොරව අවස්ථා කිහිපයකදීම ගොඩනැගිලි සැලැස්ම සංශෝධනය කර තිබුණි. සැලසුම් කළ පරිදි රු. මිලියන 2 ක ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රාදේශීයව සපයාගනු වෙනුවට රජයේ මුදල් වැයකර සපයා ගැනීමට සිදුවී තිබුණු අතර, ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පරිදි මහජන තරඟයට ඉදිරිපත්කර නොතිබුණි. තවද, ඉදිකිරීමට අදාළ අත්‍යාවශ්‍ය ලේඛන නිසි ලෙස යාවත්කාලීනව ගොනුකර නොතිබුණි.

(ආ) ඉංජිනේරුවරයෙකුගේ උපදේශයන් සහ අධික්ෂණයකින් තොරව පැරණි අත්තිවාරමේ කොටසක් ප්‍රයෝජනයට ගැනීම හා ගොඩනැගිල්ලේ බර දරා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා මහපෙන්වීම් ලබා නොගැනීම නිසා ඉදිකිරීම සිදුකරන අතරතුර අඩි 4 ක් උසට බැඳ තිබුණු ගඩොල් බිත්ති කිහිපයක්ම පුපුරා ගෙඩනැගිල්ලෙන් පිටතට ඇලවීමෙන් පසුව එම බිත්ති ඉවත්කර කොන්ක්‍රීට් ටයිබීම් ඉදිකර ඒ මත වෙරගැන්වූ කුලුණුද සමඟ බිත්ති නැවත ඉදිකිරීමට සිදුව තිබුණු අතර, මෙමඟින් විනාශ වූ අමුද්‍රව්‍ය හා ශ්‍රම හානිය ගණනයකර නොතිබුණි. තවද, ගොඩනැගිල්ලේ වැඩකටයුතු අවසන් කිරීමට දීර්ඝ කාලයක් ගත වීමටත් , සියයට සීයකින් පමණ ඉදිකිරීම් පිරිවැය ඉහළ යාමටත් මෙම තත්ත්වය හේතු වී තිබුණි.

(ඇ) දොර,ජනෙල් සඳහා වියළි සහ පදම් කළ දැව භාවිතා නොකිරීමත්, නුපුහුණු ශ්‍රමිකයින් යොදවා තනා නිමකිරීමත් නිසා බොහෝ දොර ජනෙල් සුමටව වැසීමට නොහැකි වන ලෙස ඇදවී තිබුණු අතර, දොර ජනෙල් වැසීමෙන් පසුව විශාල හිඩැස් දක්නට ලැබුණි. ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කළ ලී පංතිය පිළිබඳව තාක්ෂණ වාර්තාවකින් තහවුරුවක්ද ලබාදී නොතිබුණු අතර, නාන කාමරවල සහ ස්ථාන කිහිපයක බිම් ගඩොල් ඇතිරීම සුමටව සිදු නොකිරීම නිසා ජලය කාන්දුවෙමින් පැවතුණි.

(259)

3.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව එකතුව රු.මිලියන 3.43 ක් වැයකර මිලදී ගත් ටයර්, ටියුබ්, ට්‍රෝනර්, නිල ඇඳුම් සහ විදුලි උපකරණද, වටිනාකම හෙලිදරව් නොවූ ටයර්, ටියුබ්, ට්‍රෝනර්, විදුලි උපකරණ, නිල ඇඳුම් හා රෙදි සහ එකතුව ඒකක 34,873 ක් ද දීර්ඝ කාලයක් නිකුත් නොවී පැවතීම නිසා ගබඩා තුළම කල්ඉකුත් වී තිබුණු අතර, රු. 165,193 ක් වැයකර මිලදී ගත් විදුලි උපකරණ 17 ක නිදහස් වගකීම් කාලයෙන් අර්ධයකට වැඩි කාලපරිච්ඡේදයක් උපයෝජනය නොකර නිෂ්කාර්යව ගබඩාකර තිබුණි. තවද, 2018 වර්ෂය හෝ ඊට පෙර සිට නිකුත් නොවන හෝ සෙමෙන් නිකුත් වන එකතුව ඒකක 163,568 ක නිල ඇඳුම් වර්ග, රෙදි වර්ග සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය පැවති අතර, මෙම තොග ඒකකවලින් තොග ඒකක 130,505 ක වටිනාකම රු.මිලියන 74.05 ක් ලෙස අනාවරණය කර ඇතත්, තොග ඒකක 33,063 ක වටිනාකම විගණනයට අනාවරණය නොකෙරුණි. මෙයින් කළු අත්මේස් 311 ක්, සුදු අත් මේස් 181 ක් හා කළු ලොකු ලේන්සු 159 ක් ප්‍රයෝජනයට ගතනොහැකි වන සේ අවපැහැ ගැන්වී තිබුණි. මෙම තොග ඒකක තවදුරටත් කල්ඉකුත් වීමට නොදී රජයට ප්‍රයෝජනවත් ආර්ථික ප්‍රතිලාභ ගෙන එන පරිදි උපයෝජනය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2019 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල සිට තොග ගබඩාවලින් ඉවත්කරන ලද හෝ පරිහරණයකර භාවිතයෙන් ඉවත්කර දැනට සේරුපිට බලකා මූලස්ථානයේ ගබඩාකර ඇති වර්ග 151 ක විවිධ භාණ්ඩ හා උපකරණ අයිතම 1,228 ක්, ටයර් වර්ග 58 කට අයත් ටයර් 676 ක්, මෝටර් වාහන 17 ක්, ත්‍රීරෝද රථ 05 ක්, යතුරුපැදි 26 ක් හා පාපැදි 05 ක් මෙන්ම කතරගම,උහන ,මහඔය,අම්පාර හා මොනරාගල බලකා මූලස්ථාන ගබඩාවල ඇති අපහරණ භාණ්ඩ වර්ග 305 ක භාණ්ඩ අයිතම 2,554 ක් සමාලෝචිත වර්ෂයේදීද අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණු අතර, මෙම භාණ්ඩ සහ වාහනවල වටිනාකම් විගණනයට හෙලිදරව් නොකෙරුණි.

3.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

2016 වර්ෂයේ කතරගම බලකා මූලස්ථානයේ පළල අඩි 16 ක් හා දිග අඩි 903 ක් වන ප්‍රධාන අභ්‍යන්තර මාර්ග පද්ධතිය කොන්ක්‍රීට් අතුරා නවීකරණය කිරීම සඳහා ප්‍රදේශයේ පුද්ගලික ආයතනයකින් සිමෙන්ති, ගල්, වැලි ඇතුලු ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල් පත්‍රයකට

රු.584,200 ක් ගෙවා තිබුණු අතර, අදාළ ඉදිකිරීම් ද්‍රව්‍ය මේ වන තෙක් කතරගම බලකා මූලස්ථානයට ලැබී නොමැති අතර, එම මාර්ගයේ අලුත්වැඩියාවද සිදුකර නොතිබුණි.

3.5 පාඩු හා හානි

2020 වර්ෂයේ සිදුවූ එකතුව රු. මිලියන 3.19 ක අලාභ හානි හතරක් සම්බන්ධයෙන් අයකර ගැනීමේ හෝ කපා හැරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

සිවිල් ආරක්ෂක භටයින් 3,300 ක් විදුලි වැට (අලිවැට) නඩත්තු කිරීම සඳහා ද, භටයින් 845 ක් වනඅලි පලවාහැරීම සඳහා ද, භටයින් 389 ක් වනජීවී කාර්යාල කටයුතු සඳහාත් එකතුව වශයෙන් භටයින් 4,534 ක් අනුයුක්ත කර තිබුණි. ශ්‍රී ලංකාවේ මේ වන විට ඉදිකර ඇති මුළු අලිවැට ප්‍රමාණය කි.මී.4,756 ක් වන අතර, මෙයින් කි.මී. 4,725 ක් හෙවත් සියයට 99 ක් ම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට නඩත්තු කටයුතු සඳහා භාරදී ඇත. මේ සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු දෙක සම්බන්ධීකරණයවන ආකාරය හෝ අනෝන්‍ය සේවාවන් සපයන ආකාරය පිළිබඳවත් මුදල් වෙන්කරන ආකාරය පිළිබඳවත් පොදු එකඟතාවයක් ඇති කරගෙන නොතිබුණි. වනඅලීන් පලවාහැරීම සඳහා වාර්ෂිකව රු. මිලියන 427 කට අධික වැටුප් හා දීමනා පිරවැයක් දරා සිවිල් ආරක්ෂක භටයින් 845 දෙනෙකු යොදාවා ගෙන තිබුණු අතර, මෙම භටයින්ට ඒ සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබා දී නොතිබුණි. තවද, වනඅලින් පලවාහැරීම සඳහා යොදවාගැණුනු භට පිරිස්වල කටයුතු අධීක්ෂණය කිරීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන් හෝ වනජීවී දෙපාර්තමේන්තු නිලධාරීන් විධිමත්ව පත්කර නොතිබුණු අතර, වනඅලින් පලවා හැරීම සඳහා යටෝක්ත සෙබළුන්හට නිසිපරිදි අවශ්‍ය උපකරණ , ආයුධ සහ අලි වෙඩි ප්‍රමාණවත් පරිදි සපයා නොතිබුණි. 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ අලි වැටවල් ඉදිකිරීම සඳහා දරා ඇති මුළු ප්‍රාග්ධන වියදම රු. බිලියන1.64 ක් වන අතර, 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අලිවැටවල් නඩත්තු කිරීම සඳහා නිලධාරීන්ගේ වැටුප් ඇතුළුව දරා ඇති මුළු වියදම රු. බිලියන 1.16 ක් වී තිබුණි.
අදාළ කාලපරාසය තුළ අලිමිනිස් ගැටුම හේතුවෙන් මිනිසුන් 989 දෙනෙකුද, අලි ඇතුන් 3,646 දෙනෙකුද මිය ගොස් ඇති අතර, පෙර වර්ෂවලට සාපේක්ෂව ආසන්න වර්ෂවල සිදුවූ ජීවිතහානි වැඩි වී තිබුණත්, යොදවා ඇති සිවිල් ආරක්ෂක භටයින්ට මෙම තත්ත්වය පාලනය කරගැනීමට නොහැකි වී තිබුණි.

257

4. මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ සිවිල් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩුවක්, තෘතියක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 13 ක් ඇතුළු පුරප්පාඩු 40 ක් ද සෙසු නිල හා හට/හටවරියන්ගේ පුරප්පාඩු 5,296 ක් ද පැවතුණි. එම පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැළපෙන ලෙස අනුමත කාර්ය මණ්ඩලය සමාලෝචනය කරගැනීමට කටයුතුකර නොතිබුණු අතර, දෙපාර්තමේන්තුවේ 34,866 ක් වූ තත්‍ය කාර්යමණ්ඩලයේ කාර්යසාධනය ඉහළ නංවාගැනීමේ අරමුණ ඇතිව සමාලෝචිත වර්ෂයේ කිසියම් හෝ පුහුණුවක් ලබා දී තිබුණේ නිලධාරීන්/සේවකයින් 86 දෙනෙකුට පමණි.

පී.එල්.කේ.පෙරේරා
අතිරේක විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4 කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%- 74%
අතිගරු ජනාධිපතිතුමන්ගේ "රට හදන සෞභාග්‍යයේ පෙර දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉදිරි ව්‍යාපෘති හා සැලසුම් සකස් කර ක්‍රියාවට නැංවීම		√	
තිරසර සංවර්ධන ජාතික සභාව විසින් ප්‍රකාශිත ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තු සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම		√	
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අලුතින් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කර ගැනීම හා දැනට අනුමත කර ඇති උසස් කිරීමේ පරිපාටිය වර්තමාන අවශ්‍යතාව පරිදි සංශෝධනය කිරීම			√
දෙපාර්තමේන්තු පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම	√		
කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම හා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව)	√		
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු කෘෂි, පශු හා විවිධ නිෂ්පාදන ව්‍යාපෘතීන්හි අපේක්ෂිත නිෂ්පාදන / අස්වනු ඉලක්ක සපුරා ගැනීම හා අපේක්ෂිත ආදායම මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම.		√	
විවිධ ඉදිකිරීම්, සිද්ධස්ථාන හා පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂක නඩත්තු, සංරක්ෂණ, නගර අලංකරණ ආදී වශයෙන් පැවරෙන ව්‍යාපෘතීන් නිසි පරිදි ඉටුකිරීම		√	

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2021 භෞතික ප්‍රගතිය *	2021 වර්ෂයේ ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය **		
				0%-49%	50%-74%	75%-100%
තිරසර සංවර්ධන අරමුණු 02- සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.						
2.c **සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැළැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපොළවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.**	1.විවිධ මහා පරිමාණ කෘෂි, පළතුරු, පශු හා වෙනත් දේශීය ආහාර නිෂ්පාදන ව්‍යාපෘති සිදු කිරීම.	i.වාර්ෂිකව වී, එලවලු,බඩඉරිඟු, කජු, දේශීය අඹ විවිධ ධාන්‍ය, කුළු බඩු,වගා කිරීම. වාර්ෂිකව කිරි, බිත්තර, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය කිරීම.	a.වගාකළ අක්කර ගණන/බෝග වශයෙන් වී - අක්කර 4,686 බඩඉරිඟු - අක්කර 367 කජු - අක්කර 1700 කවුපි - අක්කර 469 කුරක්කන් - අක්කර 460 උඳු - අක්කර 307 මුං ඇට - අක්කර 508 තල - අක්කර 366 රටකජු - අක්කර 456 වෙනත් භෝග - අක්කර 271			76
			b.ඵලදාව කිලෝ ගණන/බෝග වශයෙන් වී - කි.ග්‍රෑ 2,190,127 බඩඉරිඟු - කි.ග්‍රෑ 11,618 කජු - කි.ග්‍රෑ 57,793 කවුපි - කි.ග්‍රෑ 6,310 කුරක්කන් - කි.ග්‍රෑ 801 උඳු - කි.ග්‍රෑ 483 මුං ඇට - කි.ග්‍රෑ 1,575 තල - කි.ග්‍රෑ 2,419 රටකජු - කි.ග්‍රෑ 12,965 වෙනත් භෝග - කි.ග්‍රෑ 15,549		70	

	2.අපනයන ඉලක්ක කරගත් කෘෂිකර්මාන්තය	**ii.වාර්ෂිකව බෝග වගා කිරීම.**	**භාණ්ඩාගාර ඒකාබද්ධ අරමුදල වෙත රු. 370,239,256.42 මුදලක් ප්‍රේෂණය කර ඇත.**		**74**	
	3.දියර කිරි ජීවානුහරණයකිරීම හා දියර කිරි යොදාගනිමින් අගය එකතුකල නිෂ්පාදන හඳුන්වා දීම	iii. දියර කිරි යොදාගනිමින් අගය එකතුකල නිෂ්පාදන සංඛ්‍යාවක් හඳුන්වා දුන් දීම				
තිරසර සංවර්ධන අරමුණු 03-නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම						
		i. වාර්ෂිකව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.	e.වාර්ෂික දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන	30		
තිරසර සංවර්ධන අරමුණු 04-පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.						
	1. දිවයිනේ ගුරුවරුන් හිඟ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පාසල් 139 ක ගුරුවරුන් ලෙස දැනුම හා නිපුණතාව ඇති සිවිල් ආරක්ෂක නිලධාරීන් අනුයුක්ත කරවීම	i. 2025 වන විට ගුරු හිඟතා ඇති දිවයිනේ සියලුම පාසල් වෙත අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාව මත නිසි පුහුණුව හා නිපුණැති ගුරුවරුන් අනුයුක්ත කරවීම සහ එමඟින් සෑම දරුවකුටම අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම	f. අනුයුක්ත සිවිල් ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව/ වාර්ෂික			**99**
			g. ආවරණය කළ ශිෂ්‍ය සංඛ්‍යාව/වාර්ෂික			
			h. ආවරණය කළ පාසල් සංඛ්‍යාව/වාර්ෂික			
	2. සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය තුල පෙර පාසල් දරුවන් සඳහා දිවාසුරැකුම් හා මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම.	vi. වර්ෂ 2025 වන විට සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය 750 දක්වා තවදුරටත් ව්‍යාප්ත කර තවත් දරුවන් 5000 කට පමණ පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන පහසුකම් ලබාදීම	i. පෙර පාසල් සංඛ්‍යාව			**75**
			j. පෙර පාසල් දරුවන් සංඛ්‍යාව			**75**
		vii. යෙදවීමට අපේක්ෂිත නිලධාරිණියන් හට විධිමත් පුහුණුවක් ලබා දීම.	k. ඒ සඳහා පුහුණු කරන ලද සිවිල් ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව			**75**
	3. සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයන්ගේ පාසල් යන වයසේ සෑම දරුවකුටම අවශ්‍ය අභ්‍යාස පොත් කට්ටලයක් බැගින් වාර්ෂිකව ලබා දීම	viii.වර්ෂ 2025 වන විට සිවිල් ආරක්ෂක බළකා නිලධාරීන් ගේ සහ ආශ්‍රිත අඩු ආදායම්ලාභී පවුල් වල සියලුම දරුවන්ට අවශ්‍ය අභ්‍යාස පොත් ලබාදීම	l. ආවරණය කරන ලද දරුවන් සංඛ්‍යාව			**75**

තිරසර සංවර්ධන අරමුණු 06-සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම						
6 b. ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගිත්වය, දිරිගැන්වීම සහ සහාය ලබා දීම	1.දිවයින පුරා ගොඩ වූ වැව් නැවත සැකසීම සහ අපවිත්‍ර වූ වැව් පිරිසිදු කර පිළිසකර කිරීම සඳහා අදාල ආයතන සමඟ කටයුතු කිරීම	i. ගොඩ වූ හා අපවිත්‍ර වූ වැව් මහජන පරිභෝජනයට සුදුසු වන පරිදි සහ කෘෂිකර්මාන්තයට යොදා ගත හැකි ලෙස පිළිසකර කිරීම.	a. පිළිසකර කරන ලද වැව් සංඛ්‍යාව		**63**	
තිරසර සංවර්ධන අරමුණු 09 -සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම						
තිරසර සංවර්ධන අරමුණු 11 - නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම						
11.4 ලෝකයේ ස්වභාවික සහ සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.	1.දිවයින පුරා පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකම සහිත ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම සහ සංචාරක වශයෙන් වැදගත්කමක් ඇති ස්ථාන සඳහා අවශ්‍ය වන පරිදි ආරක්ෂාව සැලසීම	i. දිවියින පුරා විහාරස්ථාන සහ පුරාවිද්‍යා ස්ථාන අලුත්වැඩියා, නඩත්තු සහ ආරක්ෂක රාජකාරි සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයන් යොදවා ගැනීම.	a. නඩත්තු සහ ආරක්ෂක රාජකාරි සඳහා යොදවා තිබූ සාමාජික සංඛ්‍යාව			**75**
	2.පළාත් සභා සහ පළාත් පාලන ආයතන, විහාරස්ථාන හා ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍යම පරිමාණ ඉදිකිරීම් කටයුතු ඉටු කරවා ගැනීමේදී ශ්‍රම බලකායේ සේවය ලබාදීම	ii.2030 වර්ෂය වන විට දිවයිනේ සියලුම පුරාවිද්‍යා ස්ථාන වල අලුත්වැඩියා නිම කර ආරක්ෂා කිරීම සඳහා අදාල ආයතන වෙත ශ්‍රමය මූලික සහාය සේවා ලබා දීමට කටයුතු කිරීම.	b. ශ්‍රම බලකායේ සේවය ලබා දුන් විහාරස්ථාන හා ආගමික සිද්ධස්ථාන ගණන			**75**
	3. 2025 වර්ෂය වන විට රජයේ මහා පරිමාණ ඉදිකිරීම් සහ ආගමික සිද්ධස්ථාන සඳහාත් ඉදිකිරීම් කර්මාන්තයටත් අවශ්‍ය ඉංජිනේරු ගඩොල් මහා පරිමාණයෙන් නිෂ්පාදනය සහ සහන මිලට වෙළඳපලට නිකුත් කිරීම	iii.වාර්ෂිකව ඉදිකිරීම් සඳහා අවශ්‍ය ගඩොල් සහන මිලට නිෂ්පාදනය කිරීම.	a. නිෂ්පාදනය කරන ලද ඉංජිනේරු ගඩොල් ප්‍රමාණය			**80**
			b. වෙළඳපලට නිකුත් කල ගඩොල් ප්‍රමාණය		**55**	
	4.නැහෙනහිර පළාතේ තර්ජනයට ලක් වූ පූජා භූමි ආරක්ෂා කිරීම.	vi.නැහෙනහිර පළාතේ තර්ජනයට ලක් වූ ප්‍රමුඛ පූජාස්ථාන පිළිසකර කිරීම හා රැක ගැනීම සඳහා සුදුසු පියවර ගැනීම.	a. හඳුනාගත් ප්‍රමුඛ පූජනීය ස්ථාන සංඛ්‍යාව	**40**		
			පූජා භූමි සංඛ්‍යාව		**60**	

තිරසර සංවර්ධන අරමුණු 13 - දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම.						
13.1 සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වාභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්ත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම	1. රට තුළ ඇතිවන විවිධ ආපදා (ගංවතුර, නායයෑම්, සුනාමි වැනි) අවස්ථාවන්හිදී ආපදා කළමනාකරණ කාර්යන්වලට සහාය වීම ක්ෂණික ප්‍රතිචාර මූදවා ගැනීමේ සහ සහන සැලසීමේ ඒකකයක් ස්ථාපිත කිරීම. ත්‍රිවිධ හමුදාව හා සිවිල් පුද්ගලයින් පූර්ණ කිරීම සඳහා ක්ෂණික ක්‍රියාකාරී යාත්‍රා බළසඟ මුලස්ථානයෙහි පුහුණු පාසලක් ස්ථාපිත කිරීම	i. ව්‍යසන අවස්ථාවලදි විපතට පත් ජනතාව බේරා ගැනීම්, ආරක්ෂිත ස්ථානයක් කරා රැගෙන යාම,කෑම පාර්සල් බෙදා දීම්,ලිං පිරිසිදු කිරීම් වියළි ආහාර ද්‍රව්‍ය බෙදාදීම්	a.පුහුණු කරන ලද ත්‍රිවිධ හමුදා හා සිවිල් පුද්ගලයින් සංඛ්‍යාව			**80**
			b.බේරා ගත් පුද්ගල සංඛ්‍යාව			**75**
			c.පිරිසිදු කරන ලද ලිං සංඛ්‍යාව		**65**	
			d.ආහාර ද්‍රව්‍ය බෙදා දුන් පවුල් සංඛ්‍යාව			**80**
		ii. ඒ සඳහා 2030 වර්ෂය වන විට 2500 ක සිවිල් ආරක්ෂක භට පිරිසකට විධිමත් පූර්ණ ලබා දීම සහ ඊට අදාල උපකරණ යනාදියෙන් සන්නද්ධ කිරීම.	e.පුහුණු කරන සිවිල් ආරක්ෂක භට හා සිවිල් පුද්ගලයින් සංඛ්‍යාව		**60**	
තිරසර සංවර්ධන අරමුණු 15 - භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම,ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනුරුත්ථාපනය සහ ජෛව විවිධත්වය විනාශය නැවැත්වීම.						
15.5 **ස්වභාවික වාසභූමි විනාශ වීම අවම කිරීමට කඩිනම් සහ කැපී පෙනෙන ක්‍රියාමාර්ග ගැනීම, ජෛව විවිධත්වයට හානි වීම නැවත්වීම සහ 2020 වන විට තර්ජනයට ලක් වූ ජීවී විශේෂයන් ආරක්ෂා කිරීම සහ වඳ වී යෑම වැලැක්වීම**	1.අලි මිනිස් ගැටුම් හේතුවෙන් අදාළ ප්‍රදේශවල සිදුවන හානි අවම කිරීම	i. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහායවීම සඳහා එම දෙපාර්තමේන්තුව වෙත සේවය ලබා දීම.	a.සහභාගී කරගන්නා ලද බලකා භටයන් සංඛ්‍යාව-4521 b.නිම කරන ලද විදුලි වැට දිග කි.මී4,644 මීටර් 242		**50**	
		ii. විදුලි වැට සාදා නිම කර එහි නඩත්තු කටයුතු සිදු කිරීම.				**100**
		iii.අලින් ගම් වැදීම වැලැක්වීම සඳහා වනාන්තර ආරක්ෂාව, අලි මංකඩ ඉදි කිරීම, ජල පහසුකම් සැපයීම				

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ

- මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරය අනුව, එකී කාර්යන් කිනම් තිරසර සංවර්ධන ඉලක්කයන් හා සැසඳෙන්නේද යන වග හඳුනා ගැනීම.
- එම කාර්යන්, අදාළ තිරසර සංවර්ධන ඉලක්ක හා තවදුරටත් සෘජුව සහසම්බන්ධ කර ඊට තිරසර සංවර්ධන ඉලක්ක මුලික කර ගත් නව මුහුණුවරක් ලබා දීම.
- හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලු අංශ වෙත ලබා දුන් උපදෙස් ප්‍රකාරව සැලසුම් සකස් කිරීම, එම සැලසුම් වාර්ෂිකව සැලසුම් වාර්තාවට ඇතුළත් කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කරවීම.
- ඉහත 5.1 ඡේදයෙහි හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු අතුරින් මෙම දෙපාර්තමේන්තුවේ සෘජු රාජකාරී වපසරිය තුළ නීතිය හා සාමය සුරැකීම, දිළිඳු බව පිටුදැකීම වැනි අරමුණු කිහිපයක් 75% ක පමණ ප්‍රතිශතයකින් ඉටු කිරීමට හැකි වීම.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

- මෙම දෙපාර්තමේන්තුව විශාල ශ්‍රම බලකයකින් සමන්විත දෙපාර්තමේන්තුවකි. එම ශ්‍රම බලකායට විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සරිලන හා විධිමත් ලෙස පවරාගත හැකි ඉඩම් නොමැතිකම එක් අභියෝගයකි.
- එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරගෙන යාමේදී හදිසි සම්පත් ඌනතාවන් ඇති වීම සහ අනපේක්ෂිත ව්‍යවසන වලින් ඇති වන බලපෑම් තවත් එක් අභියෝගයකි.
- තිරසර සංවර්ධන ජාතික සභාව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක වීම සඳහා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර ප්‍රකාශනයන්හි සිට සියලුම ආයතනික පරිපාටින්, සංවිධාන ව්‍යුහය යාවත්කාලීන කළ යුතුව ඇති බැවින්, ඒ සඳහා අනුගතවීමට යම් කාලයක් වැය වීම.
- මෙම සංකල්පය මෑතක සිට හඳුන්වාදුන් නව වැඩපිළිවෙලක් බැවින් පුර්ව අත්දැකීම්, දැනුම සහ යටිතල පහසුකම් සපයා ගැනීමට හැකි වන සේ මෙම සංකල්පය සාර්ථකව ක්‍රියාත්මක වන ආයතනික පුර්වදර්ශයන්හි හිඟතාව.
- තිරසර සංවර්ධන ජාතික වැඩපිළිවෙල තුළ එක් එක් ආයතනය වෙත පැවරෙන ඉලක්ක කවරේද යන්න, එම ඉලක්ක අන්තර් සම්බන්ධීකරණයට හා ඉටු කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ජාතික මට්ටමින් පුළුල් සංවිධානාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක නොවීම මත එක් එක් ආයතන මෙම වැඩසටහන තුළ හුදකලා වීම.

6 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.1.1 අනුමත කාර්ය මණ්ඩලය

අනු අංකය	තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	2021.12.31 දිනට සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
1	අධ්‍යක්ෂ ජනරාල්	දෙපාර්.		-	1	1	1	0
2	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	දෙපාර්.	-	-	1	1	1	0
3	ප්‍රධාන ගණකාධිකාරි	ශ්‍රීලංග සේ	I	SL1	1	1	1	0
4	අධ්‍යක්ෂ - පාලන	ශ්‍රීලංප සේ	I	SL1	1	1	1	0
5	අධ්‍යක්ෂ - මෙහෙයුම්	දෙපාර්.	-	-	1	1	1	0
6	අධ්‍යක්ෂ - පුහුණු	දෙපාර්.	-	-	1	1	1	0
7	අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන	දෙපාර්.	-	-	1	1	1	0
8	අධ්‍යක්ෂ - ඉදිකිරීම් හා ව්‍යාපෘති	දෙපාර්.	-	-	1	1	1	0
9	අධ්‍යක්ෂ - පර්යේෂණ හා සැලසුම්	දෙපාර්.	-	-	1	1	1	0
10	අධ්‍යක්ෂ - සුබසාධන හා සෞන්දර්ය	දෙපාර්.	-	-	1	1	1	0
11	අධ්‍යක්ෂ - පිරිස් පාලන	දෙපාර්.	-	-	1	1	1	0
12	නියෝජ්‍ය අධ්‍යක්ෂ - මෙහෙයුම්	දෙපාර්.	-	-	1	2	1	1
13	නියෝජ්‍ය අධ්‍යක්ෂ - පුහුණු	දෙපාර්.	-	-	1	1	0	1
14	නියෝජ්‍ය අධ්‍යක්ෂ - ඉදිකිරීම් හා ව්‍යාපෘති	දෙපාර්.	-	-	1	1	0	1
15	නියෝජ්‍ය අධ්‍යක්ෂ - සුබසාධන හා සෞන්දර්ය	දෙපාර්.	-	-	1	1	0	1
16	නියෝජ්‍යඅධ්‍යක්ෂ - තාක්ෂණ	දෙපාර්.	-	-	1	1	1	0
17	නියෝජ්‍ය අධ්‍යක්ෂ - ප්‍රවාහන	දෙපාර්.	-	-	1	1	1	0
18	නියෝජ්‍ය අධ්‍යක්ෂ -	දෙපාර්.	-	-	1	1	0	1

	පර්යේෂණ හා සැලසුම්							
19	ගණකාධිකාරි	ශ්‍රීලංග සේ	III/ II	SL1	1	2	2	0
20	අභ්‍යන්තර විගණක	ශ්‍රීලංග සේ	II	SL1	1	1	1	0
21	සහකාර අධ්‍යක්ෂ - පාලන	ශ්‍රීලංප සේ	III	SL1	1	1	1	0
22	බලකා අණදෙන නිලධාරී	දෙපාර්.	-	-	2	22	22	0
23	දෙවන බලකා අණදෙන නිලධාරී	දෙපාර්.	-	-	2	27	9	18
24	උපබලකා අණදෙන නිලධාරී	දෙපාර්.	-	-	2	12	02	10
25	මාණ්ඩලික නිලධාරී	දෙපාර්.	-	-	2	12	7	5
26	මූලස්ථාන අණදෙන නිලධාරී	දෙපාර්.	-	-	2	1	1	0
27	පුහුණු පාසල් අණදෙන නිලධාරී	දෙපාර්.	-	-	2	5	4	1
28	පරිපාලන නිලධාරී	කසේනි සේවය	අධි පන්තිය	MN7	2	1	0	1
29	තාක්ෂණ නිලධාරී	දෙපාර්.	-	-	2	4	0	4
30	මූල්‍ය සහකාර	ආශ්‍රිත නිලධාරී	-	MN 4	3	1	0	1
31	සංවර්ධන නිලධාරී	ආශ්‍රිත නිලධාරී	-	MN 4	3	5	1	4
32	දිස්ත්‍රික් නිලධාරී	දෙපාර්.	-	MN 4	3	100	60	40
33	කළමනාකරණ සේවා නිලධාරී	කසේනි සේවය	III/ II/I	MN 2	3	20	13	7
34	රියදුරු	රියදුරු සේවය	III/ II/I	PL 3	4	30	20	10
35	ග්‍රාමරක්ෂක/ සිවිල් ආරක්ෂක	දෙපාර්.	III	PL 2	4	30,000	27,066	2,934
36	උපපාලක/ උප නියාමක	දෙපාර්.	II	PL 2	4	6,600	5,381	1,219
37	නියාමක	දෙපාර්.	SP/ I	PL 2	4	2,300	1,609	1,691
38	නියාමක විශේෂ ශ්‍රේණිය	දෙපාර්.	SP	PL 2	4	1,000		
39	සනීපාරක්ෂක කම්කරු	දෙපාර්.	III	PL 1	4	30	20	2
එකතුව						40,193	34,233	5,960

6.1.2 කාර්ය මණ්ඩල වර්ගීකරණය

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)*
ජ්‍යෙෂ්ඨ	23	18	5
තෘතීයික	84	45	39
ද්විතියික	126	74	52
ප්‍රාථමික	39,960	34,096	5,864
එකතුව	40,193	34,233	5,960









6.1.3 සිවිල් ආරක්ෂක සාමාජික ව්‍යාප්තිය - 2021 දෙසැම්බර් 31 දිනට

බලකා මූලස්ථානය	දිස්ත්‍රික් නිලධාරී		නි/ විශේෂ ශ්‍රේණිය		නියාමක		උප නියාමක		සිවිල් ආරක්ෂක		සමස්ත බලකාය		මුළු එකතුව
	කා	පි	කා	පි	කා	පි	කා	පි	කා	පි	කා	පි	
මූලස්ථානය	4	4	8	6	9	5	86	65	103	240	210	320	**530**
වෙන්නවත්ත	-	1	-	5	3	27	50	88	170	577	223	698	**921**
කටුනායක	2	-	1	16	3	28	35	112	124	508	165	664	**829**
මහනුවර	1	-	-	18	7	42	24	159	63	618	95	837	**932**
පුත්තලම	-	1	-	27	1	51	8	175	16	768	25	1,022	**1,047**
අනුරාධපුර	3	1	3	38	20	94	68	353	112	1,702	206	2,188	**2,394**
විල්පත්තුව	-	4	-	32	1	84	5	298	24	1,374	30	1,792	**1,822**
වව්නියාව	-	2	3	19	24	50	78	139	210	654	315	864	**1,179**
කිලිනොච්චි	-	2	-	-	-	-	-	-	775	384	775	386	**1,161**
විශ්වමඩු	1	-	-	-	-	1	-	-	521	240	522	241	**763**
මුලතිව්	-	-	-	-	-	1	-	-	639	303	639	304	**943**
වැලිඔය	2	4	5	43	9	79	34	237	148	1,243	198	1,606	**1,804**
කැබිතිගොල්ලෑව	1	2	2	34	1	93	23	227	57	1,082	84	1,438	**1,522**
හොරොව්පොතාන	-	1	1	19	-	32	6	112	64	618	71	782	**853**
ගෝමරන්කඩවල	-	-	1	20	5	51	24	102	57	693	87	866	**953**
ත්‍රිකුණාමලය	-	2	1	39	14	84	37	328	57	1,105	109	1,558	**1,667**
සේරුවිල	-	-	1	30	5	89	15	263	51	1,039	72	1,421	**1,493**
පොළොන්නරුව	1	1	-	35	7	116	13	295	73	1,193	94	1,640	**1,734**
මැදිරිගිරිය	-	1	1	29	5	62	33	159	16	1,007	55	1,258	**1,313**
මහඔය	-	1	2	34	3	84	37	279	177	1,426	219	1,824	**2,043**
උහන	2	1	-	21	5	61	53	251	146	1,195	206	1,529	**1,735**
අම්පාර	-	2	1	40	5	119	41	398	216	1,821	263	2,380	**2,643**

මොණරාගල	-	3	3	49	21	142	44	311	70	1,779	138	2,284	**2,422**
කතරගම	2	-	1	14	7	33	20	119	44	788	74	954	**1,028**
සේරුපිට	3	-	1	4	3	5	25	28	51	175	83	212	**295**
ගල්කිරියාගම	-	1	-	1	-	4	9	30	8	76	17	112	**129**
කල්පිටිය	-	1	-	3	-	3	-	7	3	16	3	30	**33**
පහළලන්ද	1	-	-	1	-	5	6	38	3	37	10	81	**91**
කුරගල	1	1	-	-	-	1	1	10	15	176	17	188	**205**
එකතුව	**24**	**36**	**35**	**577**	**158**	**1,446**	**775**	**4,583**	**4,013**	**22,837**	**5,005**	**29,479**	**34,484**



6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය





මෙම දෙපාර්තමේන්තුවට නව බඳවාගැනීම් සිදු නොකරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබී ඇත. ඒ අනුව දැනට මෙම දෙපාර්තමේන්තුව වර්ෂ 10 කට අසන්න කාලයක් තිස්සේ නිලධාරීන් විශ්‍රාම යෑම, මිය යෑම, ඉල්ලා අස්වීම්, සේවයෙන් පහකිරීම් යනාදී වශයෙන් කාර්ය මණ්ඩලයේ සිදු වන අඩු වීම් ප්‍රතිපූර්ණය නොවන ක්ෂය වන දෙපාර්තමේන්තුවක් බවට පත් කර ඇත.

ඒ අනුව තාක්ෂණික, සෞන්දර්ය, ක්‍රීඩා, පරිගණක, කාර්මික වැනි විෂයන් තුළ භටයන් කැපවීමෙන් හා දැඩි පුහුණුවෙන් අත්පත්කරගත් දෙපාර්තමේන්තු කීර්තිනාමය හා ප්‍රමිතිය අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යෑමට බාධාවන් මතු වී ඇත. විශ්‍රාම යාම, මිය යෑම වැනි හේතූන් නිසා නිපුනැති නිලධාරීන්ගේ දැනුම අහිමි වීමත්, එම හිඟයට අලුතින් බඳවාගැනීම් සිදු කළ නොහැකි වීමත් ඊට හේතුවයි.

අවම වශයෙන් උක්ත කී විෂයන් සඳහා සීමාවන්ට යටත්ව හෝ නවක නිලධාරීන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට කර ඇති ඉල්ලීම් සඳහා අනුමැතිය ලැබෙන්නේ නම්, එකී කාර්ය සාධනරික්තය සාධනීය ලෙස අවම කර ගත හැකි වනු ඇත.

දෙපාර්තමේන්තුවට අනුමත කාර්ය මණ්ඩලය තුළ, උක්ත කී පුරප්පාඩු සම්පූර්ණ කිරීම ඉතා අත්‍යවශ්‍ය හා කඩිනම් අවධානය යොමුවිය යුතු කාරණාවක් බව වැඩිදුරටත් පෙන්වා දෙමු.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (2020)	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය (රු/-)	විදේශීය		
ෘත්තීය පුහුණු පාඨමාලා - රණවිරු සම්පත් කේන්ද්‍රය හේකිත්ත	6	මාස 06 පාඨමාලාව මාස 06 ප්‍රායෝගික පුහුණුව	-	-	-	පුහුණුව හා හැකියාව වර්ධනය
පදනම් ආයතනය ලිපිකරු පාඨමාලාව අදියර 1	50	දින 05	275,000	-	පාඨමාලා	එම
දේපළ උපකරණ සබැඳිව ස්ථාවර වත්කම් පවත්වාගෙන යාම/නඩත්තු කිරීම	2	දින 02	7,000	-	වැඩමුළු	එම
විනය කාර්ය පටිපාටි වැඩමුළුව	2	දින 02	7,000	-	වැඩමුළු	එම
අත්යන්ත්‍ර හා ජේෂකර්ම පාඨමාලාවේ උපදේශක රාජකාරී ලබා ගැනීම	30	දින 14	28,000	-	දේශනයක්	එම
කැළණිය විශ්වවිද්‍යාලය මගින් මෙහෙය වූ ශාස්ත්‍රපති උපාධිය	1		107,500	-	පාඨමාලා	එම
මානව සම්පත් කළමණාකරණ පාඨමාලාව	1	මාස 03	44,000	-	පාඨමාලා	එම
කොළඹ විශ්වවිද්‍යාලය ව්‍යාපාර පරිපාලනවේදය පිළිබඳ පශ්චාත් උපාධිය	1		575,000	-	උපාධිය	එම
අනුරාධපුර කාබනික පෙහොර ව්‍යාපෘතිය හඳුන්වාදීම	175	දින	98,975	-	වැඩමුළු	එම
මනෝ විද්‍යාව හා උපදේශනය	1	මාස 18	29,500	-	පාඨමාලා	එම
ලිපිගොනුකරණය පාඨමාලාව	5	දින 01	25,000	-	පාඨමාලා	එම
ගබඩාකරණය හා තොග පානය පිළිබඳ වැඩමුළුව	4	දින 02	34,000	-	වැඩමුළු	එම
වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව	2	දින 01	10,000	-	පාඨමාලා	එම
මානසික සෞඛ්‍ය පිළිබඳ මනෝ සමාජීය සහයෝගය උපයන්නන් පුහුණු කිරීමේ සහතිකපත් පාඨමාලාව	9	මාස 06	නොමිලේ පවත්වා ඇත.	-	පාඨමාලා	එම
සිවි දින පරිගණක පාඨමාලාව	3	දින 04	60,000.00	-	වැඩමුළු	එම
බියුගල් සංස්කරණ	6	දින 14		-	පාඨමාලා	එම
තෙදිනක අවි පුහුණු පාඨමාලාව ඒබී සිකුරිටාස් පුද්ගලික සමාගම	13	දින 03	-	-	පාඨමාලා	එම
එක්දින අවි පුහුණු පාඨමාලාව ඒබී සිකුරිටාස් පුද්ගලික සමාගම	34	දින 01	-	-	පාඨමාලා	එම
එක්දින අවි පුහුණු පාඨමාලාව සර්විස් ලංකා පුද්ගලික සමාගම	61	දින 01	-	-	පාඨමාලා	එම
එක්දින අවි පුහුණු පාඨමාලාව සර්විස් ලංකා පුද්ගලික සමාගම	50	දින 01	-	-	පාඨමාලා	එම
එක්දින අවි පුහුණු පාඨමාලාව ක්‍රුවුන්ට් රෝයල් පුද්. සමාගම	19	දින 01	-	-	පාඨමාලා	එම
එක්දින අවි පුහුණු පාඨමාලාව වයිකිං පුද්ගලික සමාගම	8	දින 01	-	-	පාඨමාලා	එම
ෘත්තීය පුහුණු පාඨමාලා - රණවිරු සම්පත් කේනද්‍රය හේකිත්ත	6	මාස 06 මාස 06	-	-	-	එම

***ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

- මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ වූයේ යුද සමයේ තර්ජිත ගම්මාන ආරක්ෂා කර ගනිමින් රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීමයි. ඒ අනුව කාලීන අවශ්‍යතාව මත අධ්‍යාපන, වෘත්තීය හෝ වෙනත් සුදුසුකම් ඇගයීමකින් තොරව අදාළ ප්‍රදේශයන්හි පදිංචි පුද්ගලයන් යන පදනමින් පමණක් ඔවුහු සේවයට බඳවා ගෙන ඇත. එසේ හෙයින් ඔවුන් අනෙකුත් සන්නද්ධ හමුදා හා පොලිස් සාමාජිකයන්ට සාපේක්ෂව වෘත්තීය හා තාක්ෂණික දැනුමින් අඩු ධාරිතාවක පිරිසක් විය. එසේ නමුත්, යුද විජයග්‍රහණයෙන් පසු විධිමත් විෂය නිර්දේශයක් හා කාල සටහනක් යටතේ දෙපාර්තමේන්තු පුහුණු පාසල් තුළින් ඔවුන් වෙත මූලික හා නායකත්ව පුහුණු ලබා දෙන ලදී. එමගින් ඔවුන් අනෙකුත් හමුදාවන්ට සමාන ආචාරශීලී, විනයගරුක හා වෘත්තීය හමුදාවක් බවට පරිවර්තනය කර ගැනීමට හැකි විය. තවද හමුදා සංග්‍රාම, සරඹ, තූර්ය වාදන, සෞන්දර්ය, තාක්ෂණ වැනි විෂයන්හි වර්තමාන අවශ්‍යතාවන්ට අනුකූලව ඔවුන්ට ලබාදෙනු ලබන පුහුණුව තුළින් හමුදාවක් ලෙස ඔවුන්ගේ ධාරිතා වර්ධනය අපේක්ෂා කෙරේ.

- දෙපාර්තමේන්තුවට අනුමත උසස් කිරීමේ පරිපාටිය අනුව, සේවයේ ස්ථීර වීමට හා ඉදිරි උසස් වීම් සඳහා සුදුසුකම් ලැබීමට මූලික හා නායකත්ව පුහුණු සපුරා තිබීම අනිවාර්ය වේ.

- බාහිර වෘත්තීය පුහුණු ආයතන වෙතින් විවිධ වෘත්තීය පුහුණු ලබා දීම තුළින් සිවිල් ආරක්ෂක සාමාජිකයන් සේවයෙන් විශ්‍රාම ලැබූ පසු වුවද තම දැනුම හා පරිචය භාවිතයෙන් විවිධ කර්මාන්තයන්හි ස්වයං රැකියාවක නියැලීමෙන් අතිරේක අදායමක් ලැබිය හැකි වනු ඇත.

- ඊට අමතරව, විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව මණ්ඩලය වැනි විවිධ බාහිර ආයතන වෙතින් හා සුදුසුකම් ඇති දෙපාර්තමේන්තු සම්පත්දායකයන් වෙතින් ඔවුන් වෙත ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සංග්‍රහය, ප්‍රසම්පාදන සංග්‍රහය, රජයේ ආයතනික ගිණුම්කරණය, වැටුප් සැකසීම, විගණනය, කාර්යාලීය කාර්ය පරිපාටි, දෙවන භාෂා පාඨමාලා යනාදී වශයෙන් විවිධ පුහුණු ලබා දීම තුළින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

7 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.6	වෙනත්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ.	වසංගත තත්වය ආදී හේතු නිසා පිළිතුරු ප්‍රමාද වූ අවස්ථා පවතී	මාසයක කාලයක් තුළ දී පිළිතුරු සැපයීම
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	-	-

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA/AMC/M/2020/5-4 (2020.06.11) චක්‍රලේඛය අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 02 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	-	අනුකූල නොවේ	කල්බදු ගෙවනු ලබන වාහන මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැත.

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නිරවුල් කරමින් පවති	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	වර්ෂය අවසාන විමට පෙර පියවා ඇත	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	--	--
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම-**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.	--	--
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.	--	--
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.	--	--
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.	--	--
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.	--	--
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.	--	--
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.	--	--

අවසානය.

කාර්ය සාධන වාර්තාව - 2021		
අනුමැතිය		
මේජර් ජෙනරාල් එන්ආර් ලමාහේවාගේ (විශ්‍රා)	අධ්‍යක්ෂ ජනරාල්	
සංස්කරණ හා ප්‍රතිශෝධන කමිටු සාමාජිකයින්		
ලුතිනන් කර්නල් ආර්.එම්.සි.එල්.කේ.කේ. රත්නායක	අධ්‍යක්ෂ (ව්‍යාපෘති)	සභාපති
ලුතිනන් කර්නල් තාරක සමරකෝන්	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාපෘති)	සාමාජික
ලුතිනන් කර්නල් ජීආර්යූබී අබේරත්න	අණදෙන නිලධාරි - සේරුවිල බලකාය	සාමාජික
ලුතිනන් කර්නල් ඩී.ආර්. තාරුකරත්න	අණදෙන නිලධාරි - ගල්කිරියාගම පුහුණු පාසල	සාමාජික
වී.ආර් සම්පත් මහතා	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති ගිණුම්)	සාමාජික
එන්.ඒ.ඒ.ඒ.එච්. නිශ්ශංක මහතා	පරිපාලන නිලධාරී (වැඩ බලන)	සාමාජික
අධීක්ෂණය හා මෙහෙයවීම		
රියර් අද්මිරාල් යූ.අයි. සේරසිංහ	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	
බ්‍රිගේඩියර් වී. වීරක්කොඩි (විශ්‍රා)	අධ්‍යක්ෂ (පාලන)	
ඩී. නර්මදා ජයනන්ද මෙනෙවිය	සහකාර අධ්‍යක්ෂ (පාලන)	
කෙටුම්පත්කරණය, සැකසුම හා පරිගණක යතුරු ලියනය		
ජී.බී.එම්.ටී.එම්. බණ්ඩාර මහතා	කළමනාකරණ සේවා නිලධාරී	